

# කාර්යසාධන වාර්තාව
# செயலாற்றல் அறிக்கை
# Performance Report
# 2015

කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சு

Ministry of Hill Country New Villages, Infrastructure and Community Development

# කාර්යසාධන වාර්තාව - 2015

# செயலாற்றல் அறிக்கை - 2015

# Performance Report - 2015


කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சு

Ministry of Hill Country New Villages, Infrastructure and Community Development

කාර්යසාධන වාර්තාව 2015
செயலாற்றல் அறிக்கை - 2015
**Performance Report 2015**

කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය
மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சு
Ministry of Hill Country New Villages, Infrastructure and Community Development

P.O. Box 562, No. 45, St. Michale's Road, Colombo 03.
Tel: 0112 541 369 Fax : 0112 328 117
Email : smpid@sltnet.lk / mhplanning2016@gmail.com
Web site www.mpid.gov.lk

Printed by : Printec Establishment | 0112 815 816

# කාර්යසාධන වාර්තාව 2015

කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම්
හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

# දැක්ම

වැව්ලි ක්ෂේත්‍රයේ ප්‍රජාව, අන් ජන කොටස් හා සමාන සමාජ තත්ත්වයකින්, ආත්ම ගෞරවයකින් හා අභිමානයකින් හෙබි ග්‍රාමිය ප්‍රජාවක් ලෙස පරිණාමනය කිරීම

# මෙහෙවර

වැව්ලි අංශයේ ජනතාවගේ සුභසාධනය,  ඔවුන්ගේ වාසස්ථාන, ජීවන තත්ත්වය හා සමාජ ආර්ථික පහසුකම් වැඩි දියුණු කිරීම තුලින් ප්‍රවර්ධනය කිරීම

## පටුන


1. හැඳින්වීම

2. අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනික ව්‍යුහය

3. අමාත්‍යාංශයේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල ව්‍යුහය

4. අමාත්‍යාංශයේ ප්‍රමුඛතා

5. අමාත්‍යාංශයේ වියදම් සාරාංශය

6. සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘතිවල ප්‍රගතිය

    6.1. කඳුරට නව ගම්මාන සඳහා නිවාස

    6.2. ජීවනෝපාය හා මූලික පහසුකම් වැඩි දියුණු කිරීම

    6.3. පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධනය

7. අමාත්‍යාංශය විසින් අත්කර ගන්නා ලද විශේෂ ජයග්‍රහණ

    7.1. වැවිලි ප්‍රජාවගේ සමාජ සංවර්ධනය සඳහා පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම

    7.2. වැවිලි ප්‍රජාවගේ ජන ජීවිත අභිමානය නැංවීම හා නිවාස හිමිකම් තහවුරු කරදීම

    7.3. වැවිලි අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා විදේශීය අරමුදල් ව්‍යාපෘති

8. අමාත්‍යාංශ විෂය පථය යටතේ ගැනෙන ආයතනවල ප්‍රගතිය

    8.1. වැවිලි මානව සංවර්ධන භාරය

    8.2. සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම

# 1. හැඳින්වීම

ශ්‍රී ලංකාව සිය සමාජ හා මානව සංවර්ධන ක්ෂේත්‍රය තුළ අත්කරගෙන ඇති ඉහළ මට්ටමේ දියුණුව සම්බන්ධයෙන් දීර්ඝ කාලීනව පිළිගැනීමකට ලක්ව සිටින අතර, වසර 2015 වන විට තම සහශ්‍ර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා අවැසි නිසි මාවත කරා අවතීර්ණ වී ඇත. කෙසේ වුවද, අත්කරගනු ලැබ ඇති ප්‍රශංසනීය ප්‍රතිඵල රට තුළ මෙන්ම ජනවර්ග හා සමාජ කණ්ඩායම් අතර සමව බෙදී නොයෑම හේතුවෙන්, තවදුරටත් අභියෝගවලට මුහුණ පෑමට සිදුවී ඇත.

ඉන්දියානු සම්භවයක් සහිතව ශ්‍රී ලංකාවේ වෙසෙන දමිළ ජන බහුතරයකින් සමන්විතවන වැවිලි ප්‍රජාව එබඳු එක් කණ්ඩායමක් වන අතර, සමස්තයක් වශයෙන් ගත් කළ එය සුවිශේෂී තත්ත්වයකි. තේ සහ රබර් වතු ආශ්‍රිතව ලයින් කාමර සහිත පේළි නිවාස වල වෙසෙන දිළිඳු කම්කරු ජීවන රටාවකට හිමිකම් කියන ඔවුන්, අඩු ආදයම් මට්ටමක් සහිතව, ඉහළ දරිද්‍රතාවයෙන් පෙළෙන පසුගාමී ජනතාවක් බවට පත්ව ඇත. ශ්‍රී ලංකාව සිය ජාතික මට්ටමේ සහශ්‍ර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ දර්ශක බොහොමයක් නිසි දිශානතියකින් යුතුව පවත්වාගෙන ගියද, වතු අංශය සම්බන්ධයෙන් සලකා බලන කළ එය නිසි මාවතින් බැහැරව පිහිටි ජාතික මට්ටම හා අනුරූපී නොවූ තත්ත්වයකි.

**1 වන වගුව: වතු ආශ්‍රිත ප්‍රජාව පිළිබඳ සංඛ්‍යා ලේඛන**

| දර්ශකය | ජාතික | නාගරික | ග්‍රාමීය | වතු |
|---|---|---|---|---|
| **දරිද්‍රතාව හා මානව වාසස්ථාන පිළිබඳ දර්ශක** | | | | |
| දරිද්‍රතා ඒක ශීර්ෂ අනුපාතය (HIES 2013) | 6.7 | 2.1 | 7.6 | 10.9 |
| සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය සපයා ගැනීම % (HIES 2013) | 89.7 | 98.9 | 90.9 | 52.4 |
| අර්ධ ස්ථිර නිවාස % (HIES 2013) | 17.8 | 7.4 | 16.9 | 76.1 |
| සාක්ෂරතා අනුපාතය %( HIES2013) | 95.7 | | | 86.1 |
| දියුණු සනීපාරක්ෂක ක්‍රම සලසා ගැනීමට යොමුවූ පවුල් % (HIES 2012/2013) | 87.2 | | | 73.3 |
| ස්ථාපිත ජාතික භෞතික ප්‍රමිතීන්ට සරිලනසේ පිහිටුවා ඇති පූර්ව ළමා සංවර්ධන මධ්‍යස්ථාන % | 50.7 | | | 24 (සියලු වතු)<br>64(ප්‍රා.වැ.ස.වතු) |
| **සෞඛ්‍ය දර්ශක** | | | | |
| නව උපත් මරණ අනුපාතය % (උපත් 1000කට) | 11 | 6.0 | 15.0 | 18.0 |
| ළදරු මරණ අනුපාතය % (උපත් 1000කට) | 9.7 | 10.0 | 19.0 | 29.0 |
| වයස අවුරුදු 5ට අඩු ළමුන් හා ප්‍රජනන වියේ පසුවන කාන්තාවන් අතර රක්තහීනතාව % | 20% (යුනිසෙෆ් 2012) | | | 61% ( යුනිසෙෆ් 2012) |
| **පෝෂණය ආශ්‍රිත දර්ශක** | | | | |
| වයස අවුරුදු 5 ට අඩු මන්දගාමීව වැඩෙන ළමුන්ගේ අනුපාතය | 18 | 13.8 | 16.2 | 40.2 |
| වයස අවුරුදු 5 ට අඩු, අඩු බරැති ළමුන්ගේ අනුපාතය | 21.8 | 16.5 | 21.2 | 30.1 |
| අඩු උපත් බර (කි.ග්‍රෑ. 2.5 ට අඩු) | 16.6 | 12.8 | 16.4 | 31.0 |
| වයස අවුරුදු 5 ට අඩු කෘෂව වැඩුනු (එනම් උසට සරිලන අඩුබර)ළමුන් | 14.7 | | | 16.4 |

**මූලාශ්‍රය : ජනගහන සෞඛ්‍ය සමීක්ෂණය (DHS) 2006/07, ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය** (HIES)2012/13

මේ අනුව, බොහෝ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වතු ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා විවිධ ප්‍රයත්නයන් දරා ඇත. එසේ වුවද, පවත්නා ගැටලු විසඳීම අරබයා අඛණ්ඩ හා නිත්‍ය ක්‍රියාදමයක් අවශ්‍ය වී ඇත.

2015 දී නව රජයේ ආරම්භයත් සමග, කැබිනට් අමාත්‍යවරයෙකුගේ අධීක්ෂණය යටතේ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවන ලදී. එම අමාත්‍යාංශයේ ප්‍රධාන අපේක්ෂාව වූයේ, වැවිලි ප්‍රජාවගේ වාසස්ථාන, ජීවන තත්ත්වය සහ සමාජ ආර්ථික පහසුකම් වැඩිදියුණු කර, වැවිලි කර්මාන්තය නගා සිටුවීම සඳහා ඵලදායී මානව සම්පතක් සුරක්ෂිත කෙරෙන වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් ඔවුන්ගේ සුභසාධනය හා අභිමානය ප්‍රවර්ධනය කිරීමයි.

ස්වකීය ප්‍රකාශිත පොරොන්දු යටතේ, නව රජය විසින් ක්‍රියාත්මක කරන ලද අතිශය වැදගත් මූලාරම්භයන්ගෙන් එකක් වූයේ, රටෙහි පවත්නා ආසන්නතම දැවෙන ප්‍රශ්න කෙරෙහි අවධානය යොමු කරමින් **"දින සියයේ වැඩසටහන"** ඉදිරිපත් කිරීමයි. එම වැඩ පිළිවෙළට සමගාමීව වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ස්වකීය ක්‍රියාකාරී සැලැස්ම සකසා ගැනීමේ අරමුණ පෙරදැරිව ක්ෂේත්‍රයට අදළ පාර්ශවකරුවන් හා ප්‍රතිලාභීන් සමග සාකච්ඡා වට හා බුද්ධි කලම්බන සැසිවාර ගණනාවක් පවත්වන ලදී. මෙම දින සියයේ ක්‍රියාකාරී වැඩසටහනෙහි, සාර්ථක ප්‍රතිඵල අත්කර ගනු ලැබුවේ, මූලික වශයෙන් වැවිලි අංශයේ ප්‍රජාවගේ නිවාස ප්‍රශ්නය සඳහා විසඳුම් ලබාදෙමින්, ඔවුන්ගේ ජීවන තත්ත්වය හා අභිමානය නගා සිටුවීම පිණිස අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමේ කටයුතු ඉලක්ක කර ගනිමිනි.

වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින්, දින සියයේ වැඩ සටහන යටතේ මුලපුරන ලද වැඩ කටයුතු නොකඩවා ක්‍රියාවට නංවන ලද අතර, අමාත්‍යාංශයීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන නියෝජිත ආයතනයක් වන වැවිලි මානව සංවර්ධන භාරයේ විෂය පථය යටතේ පවත්නා ප්‍රදේශ හතක්[1] ඔස්සේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පළාත් පාලන ආයතන හරහා, ශ්‍රී ලංකාවේ මුළු අපනයන ඉපැයීමේ ප්‍රමාණයෙන් 15 % ක පමණ දායකත්වයක් ඇති වැවිලි අංශයේ සේවයේ නියුතු, උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ අංක: 9:201 වන නිර්දේශයෙහි ද නිශ්චිතව සඳහන් කර ඇති, විශේෂයෙන් ඉන්දීය සම්භවයක් සහිත වැවිලි ක්ෂේත්‍රයේ සේවක පවුල්වල ජීවන තත්ත්වය ඉහළ නැංවීම පිණිස පහත දැක්වෙන "ප්‍රමුඛ ක්ෂේත්‍ර" මත පදනම් වූ මූලාරම්භක වැඩසටහන් ගණනාවක් අමාත්‍යාංශය විසින් දියත් කරන ලදී

- නිවාස සංවර්ධන වැඩසටහන
- ජීවනෝපාය හා මූලික පහසුකම් වැඩිදියුණු කිරීම
- පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධනය


[1] **වැවිලි මානව සංවර්ධන භාරයට අයත් ප්‍රදේශ:**
නුවරඑළිය, හැටන්, මහනුවර, කෑගල්ල, බදුල්ල, රත්නපුර සහ ගාල්ල ලෙස ප්‍රධාන කලාප 07 කි.

**වැවිලි ආශ්‍රිත ප්‍රදේශ:**
ඉහත කලාප මගින්, ප්‍රාදේශිය වැවිලි සමාගම් (ප්‍රා.වැ.ස.) 25 ක් යටතේ පවතින වතු 435 ක් ද ඇතුළුව නුවරඑළිය, බදුල්ල, මහනුවර, මාතලේ, මාතර, ගාල්ල, කෑගල්ල, කළුතර, රත්නපුර, කුරුණෑගල, පුත්තලම සහ කොළඹ යනාදී දිස්ත්‍රික්කවලට අයත් ඇතැම් ප්‍රදේශද ආවරණය වේ.

2015 අගෝස්තු මස පවත්වන ලද පාර්ලිමේන්තු මැතිවරණයෙන් අනතුරුව මෙතෙක් පැවති වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය, එම කැබිනට් අමාත්‍යවරයාගේම අධීක්ෂණය යටතේ කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය ලෙස ප්‍රතිනාම ගත කරන ලද අතර, 2015 සැප්තැම්බර් මස 21 වන දින නිකුත් කරන ලද ගැසට් නිවේදනය මගින්, අමාත්‍යාංශයේ විෂය පථය පුළුල් කරමින්, අඩු වරප්‍රසාදලත් වතුකරයේ ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනමද මෙම අමාත්‍යාංශය වෙත පවරන ලදී.

ඒ අනුව, මෙම "2015 කාර්යසාධන වාර්තාව" මගින්, පෙර පැවති වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක කරන ලද හා අභිනව අමාත්‍යාංශය වන කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය විසින් 2015 දෙසැම්බර් මස 31 වන දින දක්වා නොකඩවා ක්‍රියාවට නංවන ලද, සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතිවල ප්‍රගතිය විස්තර කෙරේ.

## 2. අමාත්‍යාංශයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනික ව්‍යුහය



# 3. අමාත්‍යාංශයේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය

**2 වන වගුව:** කාර්ය මණ්ඩල විස්තරය ( අනුමත හා තත්‍ය ) - 2015. 12. 31 දිනට

| | තනතුර | සේවය | අනුමත | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| 1. | ලේකම් | | 1 | 1 |
| 2. | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප.සේවය | 2 | 1 |
| 3. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේවය | 1 | 1 |
| 4. | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේවය | 1 | 1 |
| 5. | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍ර.සේවය | 1 | 1 |
| 6. | අධ්‍යක්ෂ | ශ්‍රි ලං.ඉ.සේ. | 1 | - |
| 7. | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේවය | 1 | 1 |
| 8. | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේවය | 1 | 1 |
| 9. | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේවය | 1 | 1 |
| 10. | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍ර.සේවය | 2 | 1 |
| 11. | සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ඉ.සේවය | 1 | 1 |
| 12. | ගණකාධිකාරි | ශ්‍රී.ලං.ග.සේවය | 1 | 1 |
| 13. | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේවය | 1 | - |
| 14. | පරිපාලන නිලධාරි | රා.කළ.සහ.සේවය (අධි ශ්‍රේණිය) | 1 | - |
| 15. | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | 2 | - |
| 16. | තාක්ෂණ නිලධාරි | ශ්‍රී.ලං.තා.සේවය | 3 | - |
| 17. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී.ලං.තො. හා සං.තා.සේවය | 1 | - |
| 18. | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | 1 | 1 |
| 19. | සංඛ්‍යා ලේඛන නිලධාරි | | 1 | - |
| 20. | සංවර්ධන නිලධාරි | සංනිල.සේ. | 14 | 14 |
| 21. | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.කළ.සහ.සේවය | 20 | 9 |
| 22. | වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා | අමාත්‍යාංශගත | 255 | 255 |
| 23. | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | 12 | 12 |
| 24. | කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේවය | 12 | 9 |
| | **එකතුව** | | **337** | **311** |

# 4. අමාත්‍යාංශයේ ප්‍රමුඛතා

**3 වන වගුව :** අමාත්‍යාංශයේ ප්‍රමුඛතා

| | ප්‍රධාන වැඩසටහන් | ව්‍යාපෘති/ ක්‍රියාකාරකම් |
|---|---|---|
| **1.** | බුක්තිය සහ හිමිකාරිත්වය සහිත කඳුරට නව ගම්මාන සඳහා වූ නිවාස වැඩසටහන | |
| | නායයාමෙන් පීඩාවට පත්වූවන් සඳහා නිවාස | |
| | | නායයාමෙන් පීඩාවට පත්වූවන් සඳහා නිවාස 308 ක් ඉදි කිරීම |
| | නව ජීවන නිවාස වැඩසටහන | |
| | | පේළි නිවාසවල ජීවත්වන වැවිලි අංශයේ ජනතාව සඳහා නිවාස 647 |
| | ඉන්දියානු ප්‍රදන මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතිය ආශ්‍රිත නිවාස 4000 | |
| | | |
| **2.** | ජීවනෝපාය හා මූලික පහසුකම් වැඩිදියුණු කිරීම | |
| | | පවත්නා වාසයට නුසුදුසු තත්ත්වයේ ලයින් කාමර 700 ක වහලවල් සෙවිලි කිරීම |
| | | සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය සැපයීමේ ව්‍යාපෘති 19 ක් ක්‍රියාත්මක කිරීම |
| | | වැසිකිළි 700 ක් ඉදිකිරීම |
| | | ළමා සංවර්ධන මධ්‍යස්ථාන 21 ක් නගාසිටුවීම |
| | | ඉන්දීය  ප්‍රදනයන් යටතේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන 70 ක් ඉදිකිරීම |
| | | |
| **3.** | පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධනය | |
| | | |
| | නව මූලාරම්භයන් : | |
| **4.** | වැවිලි අංශයේ ජනතාවගේ සමාජ සංවර්ධනය සඳහා පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම | |
| | | |
| **5.** | වැවිලි අංශයේ ජනතාවගේ ජන ජීවිත අභිමානය ඉහළ නැංවීම සඳහා නිවාස හා ඉඩම්වල හිමිකාරීත්වය සතු ඉඩම් ඔප්පු නිකුත් කිරීම | |
| | | |
| **6.** | වැවිලි අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විදේශීය අරමුදල් ව්‍යාපෘති | |
| | | ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය |
| | | පූර්ව ළමා සංවර්ධන ව්‍යාපෘතිය |
| | | |
| **7.** | ඉන්දියානු ප්‍රදන හරහා ක්‍රියාත්මක වන නිවාස වැඩසටහන | |


# 5. අමාත්‍යාංශයේ වියදම් සාරාංශය

*(2015 ජනවාරි - දෙසැම්බර් දක්වා)*

**4 වන වගුව : වියදම් සාරාංශය**

| කාණ්ඩය / වැඩසටහන / ව්‍යාපෘතිය | 2015 සඳහා ප්‍රතිපාදන (රු:) | 2015 දෙසැම්බර් 31 දිනට වියදම (රු:) | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|
| **පුනරාවර්තන** | **322,030,000** | **271,078,561** | **84.18** |
| පුද්ගල පඩිනඩි | 194,400,000 | 173,711,838 | **89.36** |
| සාමාන්‍ය පරිපාලනය | 127,630,000 | 97,366,723 | **76.29** |
| **ප්‍රාග්ධන** | **824,440,000** | **785,800,084** | **95.31** |
| | | | |
| සාමාන්‍ය පරිපාලනය | 24,440,000 | 17,669,278 | **72.30** |
| ** සංවර්ධන වැඩසටහන් | | | |
| අ. කඳුරට නව ගම්මාන සඳහා නිවාස | 350,000,000 | 349,736,997 | **99.92** |
| ආ. ජීවනෝපාය හා මූලික පහසුකම් වැඩි දියුණු කිරීම | 150,000,000 | 146,610,281 | **97.74** |
| ඇ. පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධනය | 300,000,000 | 271,783,528 | **90.59** |
| | | | |
| **මුළු එකතුව** | **1,146,470,000** | **1,056,878,645** | **92.19** |

**ප්‍රස්ථාර 01 : සංවර්ධන වැඩ සටහන්වලට අනුරූපව අමාත්‍යාංශයේ ප්‍රාග්ධන විදයම් සාරාංශය**



## 5 වන වගුව: ** සංවර්ධන වැඩසටහන්

| වැඩසටහන/ව්‍යාපෘතිය | 2015 සඳහා ප්‍රතිපාදන (රු. මි.) | 2015 දෙසැම්බර් 31 දිනට වියදම (රු. මි.) | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|
| අ.කඳුරට නව ගම්මාන සඳහා නිවාස | | | |
| නායයාමෙන් පීඩාවට පත්වූවන් සඳහා නිවාස 308 ක් ඉදි කිරීම | 350.00 | 349.74 | 99.93 |
| අඩු ආදයම් නිවාස (නව ජීවන නිවාස - 2015) | | | |
| නව ජීවන නිවාස වැඩසටහන 617 (අවිච්ඡේද ව්‍යාපෘති ) | | | |
| හිමිකම් ඔප්පු නිකුත් කිරීම (ක්‍රියාත්මක කිරීම - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය) | | | |
| උප එකතුව | 350.00 | 349.74 | 99.93 |
| | | | |
| ආ. ජීවනෝපාය හා මූලික පහසුකම් වැඩි දියුණු කිරීම | | | |
| අතුරු පියවරක් වශයෙන් ලයින් කාමර 700ක් අලුතින් වහල සෙවිලි කිරීම | 43 | 42.79 | 99.51 |
| පානීය ජල සම්පාදන උප ව්‍යාපෘති 19ක් ඇති කිරීම | 13 | 11.37 | 87.46 |
| නව වැසිකිළි 700ක් ඉදිකිරීම | 25 | 24.59 | 98.36 |
| ළමා සංවර්ධන මධ්‍යස්ථාන 21ක් නගාසිටුවීම | 12 | 11.24 | 93.67 |
| කුසලතා / දැනුවත්භාවය වර්ධනය කිරීම | 57 | 56.63 | 99.35 |
| උප එකතුව | 150.00 | 146.61 | 97.74 |
| | | | |
| ඇ. පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධනය | | | |
| ප්‍රවේශ මාර්ග සංවර්ධනය | 150 | 39.3 | 104.34 |
| අධ්‍යාපන පහසුකම් වැඩිදියුණු කිරීම | | 13.45 | |
| ආගමික හා සංස්කෘතික සංවර්ධනය | | 16.44 | |
| ක්‍රීඩා පහසුකම් වැඩිදියුණු කිරීම | | 20.66 | |
| පොදු පහසුකම් / විශේෂ ක්‍රියාකාරකම් | | 25.42 | |
| අවිච්චේද වැඩ /මෙහෙයුම් හා ඇගයුම් | 150 | 156.51 | 104.34 |
| උප එකතුව | 300.00 | 271.78 | 90.59 |
| | | | |
| එකතුව | 800.00 | 768.13 | 96.02 |

# 6. සංවර්ධන වැඩසටහන් /ව්‍යාපෘතිවල ප්‍රගතිය
(2015 ජනවාරි - දෙසැම්බර්)

## 6.1 කඳුරට නව ගම්මාන සඳහා නිවාස

වැවිලි අංශයෙහි වෙසෙන ජනතාවට අයත් ගෘහ ඒකකවලින් 58% කට වැඩි ප්‍රමාණයක් තාවකාලික මඩු ලෙස පවතින අතර, පවුල් 169,000 ක් පමණ ඒවායෙහි ජීවත් වේ. ප්‍රමාණවත් ඉඩ පහසුකම් හා හිතකර වාතාවරණයක් එම ලයින් කාමරවල නොමැති වීම හේතුවෙන්, මෙම බැරැක්ක ලෙස තනා ඇති පේළි නිවාස වෙනුවට තනි නිවාස කඩිනම් පදනමකින් ලබාදීම අත්‍යවශ්‍ය වේ. මෙය රටේ දැඩි පීඩාකාරී ගැටලුවක් බවට පත්ව ඇති හෙයින් රජයේ දින සියයේ වැඩසටහනට විශේෂ ප්‍රමුඛතාවක් දක්වමින් නව ජීවන නිවාස වැඩසටහන, පවත්නා ලයින් කාමර අලුත්වැඩියා කිරීම, ඒවායේ වහල නැවත සෙවිලි කරදීම හා නායයාමෙන් පීඩාවට පත්වූවන් සඳහා නිවාස ඉදිකිරීම යනාදී වැඩසටහන් අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලදී.

### 6.1.1 නායයාමෙන් පීඩිතවූවන් සඳහා නිවාස 308 ක් ඉදිකිරීම

ඌව, සබරගමුව හා මධ්‍යම යන පළාත් තුල නායයාමෙන්, ගිනි ගැනීමෙන් හෝ නායයාමේ දැඩි අවදානමක් සහිත ප්‍රදේශවලින් ඉවත් කිරීම හේතුවෙන් පීඩාවට පත් වතු සේවක පවුල් සඳහා නුවරඑළිය, හැටන්, මහනුවර, කෑගල්ල, බදුල්ල හා රත්නපුරය යන ප්‍රදේශයන්හි වැවිලි මානව සංවර්ධන භාරයට අයත් ප්‍රදේශ ආවරණය වන අයුරින් රජයේ දින 100 වැඩසටහන යටතේ නිවාස 308 ක ඉදිකිරීම් ක්‍රියාත්මක කරන ලදී. නිදන කාමර 2 ක්, මුළුතැන්ගෙයක්, ආලින්දයක් හා යාකළ වැසිකිලියක් සහිතව වර්ග අඩි 550 ගෙබිමකින් සමන්විත පර්චස් 7 ක ඉඩමක එක් නිවසකට රු.මි. 1.2 ක පිරිවැයක් දරා (ජලය, විදුලිය හා ප්‍රවේශ මාර්ග යනාදී යටිතල පහසුකම් සඳහා වියදම රු.මි.0.2 ක් ද ඇතුලත්ව) තනි නිවාස ඉදිකිරීම සඳහා විශේෂ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගන්නා ලදී. ඉන් නිවාස 288 ක වැඩ කටයුතු 2015 දෙසැම්බර් 31 වන දින වන විට නිමකර ඇති අතර, ඉතිරි නිවාස 20 ඉදි කෙරෙමින් පවතී. ඉන් නිවාස 16 ක වහල මට්ටමට ඉදිකිරීම් අවසන් කර ඇත. 2015 වර්ෂය අවසන් වන විට මෙම නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකර ඇති මුදල රු.මි. 302.4 කි.


මෙම නිවාස වැඩසටහන ගම්මාන පදනම මත දියත් කෙරෙන අතර, ඊට ජල සම්පාදනය, විදුලිබල හා ප්‍රවේශ මාර්ග පහසුකම්, පන්සල්, කෝවිල්, ප්‍රජා මධ්‍යස්ථාන, ළමා සංවර්ධන මධ්‍යස්ථාන හා අනෙකුත් පහසුකම් ද ඇතුළත් වේ.

**6 වන වගුව: නායයාමෙන් පීඩිත වූවන් සඳහා ඉදිකෙරෙන නිවාස වැඩසටහනෙහි ප්‍රගතිය**

(2015 ජන: - දෙසැ: දක්වා)

| භෞතික ප්‍රගතිය | නිවාස ගණන | ව්‍යාපෘති සංඛ්‍යාව - (වැ.මා.සං. භාරයේ, ප්‍රාදේශීය කාර්යාල මට්ටමින්) | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | නුවරඑළිය | හැටන් | රත්නපුර | කෑගල්ල | බදුල්ල | මහනුවර |
| ඉදිකිරීම් වැඩ අවසන් කළ | 288 | 97 | 62 | 30 | 12 | 47 | 40 |
| වහල මට්ටමට නිමකළ | 16 | 16 | - | - | - | - | - |
| අත්තිවාරම නිමකළ | 04 | 04 | - | - | - | - | - |
| එකතුව | 308 | 117 | 62 | 30 | 12 | 47 | 40 |

**1 වන රූප සටහන - රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද අගලවත්ත වැවිලි සමාගමට අයත් රත්නපුර දොළොස්වළ වතුයායේ නොම්මර 2 කොටසේ නිවාස ඉදි කිරීමේ වැඩ සටහන**



| | |
|---|---|
| ඒකක ගණන - 30 | |
| පිරිවැය: - | රු 26,157,486.60 |
| ව්‍යාපෘතියේ ආරම්භය: - | 2015.05.21 |
| ව්‍යාපෘතියේ අවසානය: | 2015 -12-15 |

## 6.1.2 නව ජීවන නිවාස වැඩසටහන - ලයින් කාමරවල වෙසෙන කඳුකර ප්‍රජාව සඳහා නිවාස 647 ක් ඉදිකිරීම

"නව ජීවන නිවාස වැඩසටහන" යටතේ ඉදිවෙමින් පවතින නිවාස 617 හි නිවාස 61 ක වැඩ අවසන් කර ඇති අතර ඉතිරි නිවාසයන් හි ඉදිකිරීම් අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. එමෙන්ම දින 100 වැඩසටහන යටතේ අනුමත කරන ලද නව නිවාස 30 ක ඉදිකිරීම් කටයුතු ද මේ යටතේ සිදු කරනු ලැබේ. නුවරඑළිය, හැටන්, මහනුවර, කෑගල්ල, බදුල්ල, රත්නපුරය හා ගාල්ල යන වැවිලි ප්‍රදේශ 7 ආවරණය කරමින් මෙම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහන යටතේ නිවාස ඉදිකිරීම සඳහා 47% ක් ප්‍රදාන වශයෙන්ද, 53% ක් ණය මුදල් වශයෙන් ද ලබාදෙන අතර 7.5% ක පොලියක් සහිතව වසර 15 ක් තුළ මෙම ණය මුදල් අදාල වතු සේවක වැටුපෙන් අයකර ගැනේ.

**7 වන වගුව: නව ජීවන නිවාස වැඩසටහනෙහි ප්‍රගතිය**

| භෞතික ප්‍රගතිය | නිවාස ගණන (2014 සිට අවිච්ඡේද) | ව්‍යාපෘති සංඛ්‍යාව - (වැ.මා.සං. භාරයේ, ප්‍රාදේශීය කාර්යාල මට්ටමින්) | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | නුවරඑළිය | හැටන් | රත්නපුර | ගාල්ල | කෑගල්ල | බදුල්ල | මහනුවර |
| පූර්ණ නිමාව | 61 | - | - | - | 47 | 14 | - | - |
| 50% - 100 % දක්වා නිමකළ | 196 | 107 | 44 | 25 | - | 20 | - | - |
| 25% - 50 % දක්වා නිමකළ | 84 | - | 10 | 15 | - | 39 | 20 | - |
| 0-25% ක් ඉක්මවා නිමකළ | 276 | 96 | 30 | 25 | - | 45 | - | 80 |
| එකතුව | 617 | 203 | 84 | 65 | 47 | 118 | 20 | 80 |

**8 වන වගුව: දින 100 වැඩසටහන යටතේ ආගරපතන වැවිලි සමාගමට අයත් නුවරඑළිය දිස්ත්‍රික්කයේ නිව් පෝර්ට්මෝ වතුයායේ ක්‍රියාත්මක කරන ලද නව නිවාස 30 හි ප්‍රගතිය**

| භෞතික ප්‍රගතිය | නිවාස ගණන (2015) |
|---|---|
| වහල නිමකළ | 15 |
| වහල මට්ටම | 2 |
| ලින්ටල් මට්ටමට ඉහළ | - |
| ජනෙල් මට්ටම | 12 |
| අත්තිවාරම නිමකළ | 1 |
| එකතුව | 30 |

### 6.1.3 ඉන්දියානු ප්‍රදාන යටතේ ඉදිවන නිවාස 4000 ක් සඳහා වූ ව්‍යාපෘතිය

බදුල්ල, නුවරඑළිය හා හැටන් යන ප්‍රදේශවල 2013 වසරේදී ඉන්දියානු අරමුදලින් අරඹා ඇති මෙම නිවාස ව්‍යාපෘතිය, 2017 වසර තුළ අවසන් කිරීමට අපේක්ෂිතය.

**<u>I වන අදියර:</u>**

පළමුවන අදියර යටතේ නිවාස 1134 ක් ඉදිකිරීමට නියමිත අතර, මෙම නිවාස 1134 සඳහා පරිමාපක මැනුම්, කට්ටි කිරීමේ හා සමෝච්ච රේඛා මැනුම් කටයුතු අවසන් කර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිශ්කාෂණයද ලැබී ඇති අතර මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙල ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් ප්‍රතිශෝධනය කරනු ලැබ ඇත. එබැවින් වැඩසටහන ක්‍රියාවට නැංවීම ආරම්භ කිරීම සඳහා ඉන්දියානු රජයේ අනුමැතිය අපේක්ෂා කෙරේ. එක්සත් ජාතීන්ගේ යූ. එන්. හැබිටැට් සංවිධානයත් (UNHABITAT), ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයත්, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා මානව ජනාවාස සංවිධානයත්, වතු සේවක නිවාස සමුපකාර සමිති හා සම්බන්ධතාව ඇතිව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන ලෙස හඳුනා ගෙන ඇත. ගෘහ ඒකකයක ඉදිකිරීමේ පිරිවැය රු.මි. 1 ක් වන අතර අදාළ වියදම් ප්‍රතිලාභී දායකත්වය සහ ප්‍රාදේශීය වැවිලි සමාගම්වල ද (රු: 50,000 වටිනාකම) සහභාගීත්වය ඇතිව, ඉන්දියානු ප්‍රදාන වැඩසටහන මගින් දරනු ලැබේ. ඉඩම් මැනීම, සැකසීම, ප්‍රවේශ මාර්ග තැනීම, ජල සැපයුම, විදුලිය සහ අනෙකුත් පොදු යටිතල පහසුකම් පිළිබඳ වියදම් ශ්‍රී ලංකා රජය විසින් දැරීමට නියමිතය. ඉදිකිරීමේ කටයුතු, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ඊට අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමත් සමග සිදුකෙරේ.

**II වන අදියර**: *(ඉතිරි නිවාස 2866)*

මෙම අදියරේදී, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ හා ප්‍රාදේශීය වැවිලි සමාගම්වල උපදෙස් ද විමසා බලමින්, නායයාම නිසා හෝ ගිනි ගැනීම නිසා හෝ පීඩාවට පත්වූවන් සඳහා සහ නායයාම් වලට ලක්විය හැකි අධි අවදානම් ප්‍රදේශවල වෙසෙන ජනතාව වෙනුවෙන් නිවාස තනාදීමේ කාර්යය සඳහා ප්‍රමුඛතාව ලබාදී ඇත. ඒ සඳහා අවශ්‍ය ඉඩම් තෝරා ගැනීමේ කටයුතු නිමවී ඇති අතර, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිශ්කාෂණය සහ අනෙකුත් සමීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී. අමාත්‍යාංශය වෙත ලැබී ඇති නිවාස ප්‍රතිලාභීන්ගේ ලැයිස්තු අදාළ තහවුරු කරගැනීම් සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත යවා ඇති අතර එමගින් මෙම අදියර යටතේ නිවාස 399 ක් සඳහා නිර්දේශය මේ වනවිට ලබාදී ඇත.

## 6.2 ජීවනෝපාය හා මූලික පහසුකම් වැඩිදියුණු කිරීම
### (ප්‍රජා සංවර්ධන වැඩසටහන්)

ග්‍රාමීය හා වැවිලි අංශයේ ඉහළ දරිද්‍රතා මට්ටම කෙරෙහි බලපාන ප්‍රධාන හේතුව වනුයේ, මූලික හා වෙනත් ජීවනෝපායික පහසුකම් අතිශය දුර්වල තත්ත්වයක පැවතීමයි. එබැවින් ජීවන තත්ත්වය ඉහළ නැංවවීමේ අරමුණින් යුතුව වැවිලි අංශයට අයත් ප්‍රදේශ තුළ ප්‍රවේශ මාර්ග තැනීම, පානීය ජලය සැපයීම, නිවාසවල වහලවල් නැවත සෙවිලි කිරීම හා ළමා සංවර්ධන මධ්‍යස්ථාන තැනීම වැනි බොහෝ කාර්යයන් ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව 2015 වසර තුළ ආරම්භ කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘතිවල ප්‍රගතිය පහත දැක්වේ.


### 6.2.1 වාසයට නුසුදුසු තත්ත්වයේ ඇති ලයින් කාමර 700 ක වහලවල් නැවත සෙවිලි කිරීම

ලයින් කාමරවල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා වහලවල් නැවත සෙවිලි කිරීමේ කටයුතු අමාත්‍යාංශය විසින් ආරම්භ කර ඇත. නව නිවාස විශාල ප්‍රමාණයක් ඉදිකිරීම කාලය වැයවන හා වියදම් අධික ක්‍රියාදාමයක් වන බැවින් නව නිවාස ඉදිකරන තෙක් අතුරු පියවරක් ලෙස මෙය සිදු කරන ලදී. 2015 වර්ෂය අවසන් වන විට වැවිලි මානව සංවර්ධන භාරයට අයත් නුවරඑළිය, හැටන්, මහනුවර, කෑගල්ල, බදුල්ල, රත්නපුර හා ගාල්ල යන වැවිලි ප්‍රදේශ 7 ආවරණය කරමින් නිවාස 700 ක වහල නැවත සෙවිලි කිරීම සඳහා සෙවිලි තහඩු බෙදා හැර ඇත. මේ සඳහා වැය කරන ලද පිරිවැය රුː මිලියන 43 කි.

### 6.2.2 සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය සැපයීම

ජනගහනය 4,743 දෙනෙකු ආවරණය කරමින්, පවුල් 1,054 ක් සඳහා සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය සපයාදීම පිණිස නුවරඑළිය, හැටන්, මහනුවර, කෑගල්ල, බදුල්ල, රත්නපුරය හා ගාල්ල යන වැවිලි ප්‍රදේශ 7 තුළ ජල සම්පාදන ව්‍යාපෘති 19 ක් ක්‍රියාත්මක කරන ලදී. ඉන් ව්‍යාපෘති 17 ක් මේ වනවිට නිම කර ඇත. මෙම ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් මස අවසන් වන විට පිරිවැය රු.මි. 11 කි. වතු සේවක නිවාස සමූපකාර සමිති මගින් ජල සැපයුම් කමිටු පත්කර ඇති අතර, ඒ අනුව ජල සැපයුම් පද්ධති නඩත්තු කිරීම අදාළ ප්‍රතිලාභීන් විසින් සිදුකරනු ලැබේ.

**ප්‍රස්ථාර 02 :** **ජල සම්පාදන ව්‍යාපෘති ඉදිකිරීම් පිළිබඳ ප්‍රගතිය**



**2 වන රූප සටහන: රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද බලංගොඩ වැවිලි සමාගමට අයත් මාතුවාගල (BPL) වතුයායේ පහල කොටසේ ජල සැපයුම් ව්‍යාපෘතිය**






| | |
|---|---|
| **පිරිවැය: -** | රු: 909,850.50 |
| **ව්‍යාපෘතියේ ආරම්භය: -** | 2015.02.11 |
| **ව්‍යාපෘතියේ අවසානය:** | 2015.08.05 |
| **ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව** - 45 | |

- **ජල සම්පාදන ව්‍යාපෘති ඉදිකිරීම /වැඩිදියුණු කිරීම:**

මූලික පහසුකම් සැලසීමේ වැඩසටහන යටතේ, වතු 17 කට අයත් ජනතාවගේ පවුල් 3,607 දෙනෙකුගේ ප්‍රයෝජනය පිණිස පානීය ජල සම්පාදන ව්‍යාපෘති 86 ක් තෝරාගෙන ඇති අතර, දෙසැම්බර් මස අවසන් වන විට එයින් 75ක ඉදිකිරීම් කටයුතු රු: මිලියන 31 පිරිවැයකින් අවසන් කර ඇත. ඉතිරි ව්‍යාපෘති වල ඉදිකිරීම් / වැඩි දියුණු කිරීම් කටයුතු අදළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අධීක්ෂණය යටතේ සිදු කෙරේ.

## 6.2.3 සනීපාරක්ෂාව

ලයින් කාමරවල ජීවත්වන වැවිලි ක්ෂේත්‍රයට අයත් ජනතාවගේ සනීපාරක්ෂාව සැලසීමේ අරමුණින් නුවරඑළිය, හැටන්, මහනුවර, කෑගල්ල, බදුල්ල, රත්නපුරය හා ගාල්ල යන වැවිලි ප්‍රදේශ 7 තුළ වැසිකිළි 700 ක ඉදිකිරීමේ කටයුතු ක්‍රියාත්මක කරන ලදී. ඒවායේ ඉදිකිරීම් කටයුතු සඳහා වතු සේවක නිවාස සමුපකාර සමිතිවලට, අදළ කොන්ත්‍රාත්තු ප්‍රදනය කර ඇති අතර, වැසිකිළි වලවල් කැපීම වැනි කටයුතු සඳහා ප්‍රතිලාභී ජනතාවගේ දයකත්වය ලබා ගැනේ. මෙම වර්ෂය අවසන් වන විට වැසිකිළි 636 ක ඉදිකිරීම් අවසන් කර ඇත. 2015.12.31 වන විට මේ සඳහා මුළු පිරිවැය රු.මි. 25 කි.

**9 වන වගුව: වැසිකිළි ඉදිකිරීමේ ප්‍රගතිය**

| ප්‍රගතිය | වැසිකිළි සංඛ්‍යාව | ව්‍යාපෘති සංඛ්‍යාව - (වැ.මා.සං. භාරයේ, ප්‍රාදේශීය කාර්යාල මට්ටමින්) | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | නුවරඑළිය | හැටන් | රත්නපුර | ගාල්ල | කෑගල්ල | බදුල්ල | මහනුවර |
| 100 % ඉදිකිරීම් අවසන් | 636 | 100 | 61 | 90 | 100 | 100 | 100 | 85 |
| ක්‍රියාත්මක වෙමින් පවතින | 64 | - | 64 | - | - | - | - | - |
| එකතුව | 700 | 100 | 125 | 90 | 100 | 100 | 100 | 85 |

**3 වන රූප සටහන : රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද හුනුවල වතුයායේ 3 හා 4 කොටසේ වැසිකිළි ඉදි කිරීමේ ව්‍යාපෘතිය**




පිරිවැය: - රු: 463,500.00

ව්‍යාපෘතියේ ආරම්භය: 2015.03.25

ව්‍යාපෘතියේ අවසානය: 2015.07.22

ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව - 10

## 6.2.4 වැවිලි සේවක පවුල් සඳහා ළමා සංවර්ධන මධ්‍යස්ථාන

වතු ආශ්‍රිතව වෙසෙන දරු දැරියන් පාසල් අධ්‍යාපනයට සූදනම් කිරීම හා ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීමේ අරමුණු පෙරදැරිව ළමුන් 600 කට අධික ප්‍රමාණයක් ආවරණය වන අයුරින් ළමා සංවර්ධන මධ්‍යස්ථාන 21 ක් වැඩි දියුණු කිරීම මෙමගින් අරමුණු කරන ලදී. අදළ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු වතු සේවක නිවාස සමූපකාර සමිතිවලට ප්‍රදනය කර ඇත. මෙම ළමා සංවර්ධන මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් වර්ෂය අවසන් වන විට දරා ඇති පිරිවැය රු: මිලියන 11 ක් වේ.

**10 වන වගුව : ළමා සංවර්ධන මධ්‍යස්ථාන ඉදිකිරීමේ ප්‍රගතිය**

| ප්‍රගතිය | ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව | ව්‍යාපෘති සංඛ්‍යාව - (වැ.මා.සං. භාරයේ, ප්‍රාදේශීය කාර්යාල මට්ටමින්) | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | නුවරඑළිය | හැටන් | රත්නපුර | ගාල්ල | කෑගල්ල | බදුල්ල | මහනුවර |
| 100% ක් නිමකළ | 20 | 3 | 3 | 3 | 3 | 3 | 2 | 3 |
| 75% - 50% ක් නිමකළ | 1 | - | - | - | - | - | 1 | - |
| එකතුව | 21 | 3 | 3 | 3 | 3 | 3 | 3 | 3 |

**4 වන රූප සටහන: බදුල්ල ප්‍රාදේශීය කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද නමුනුකුල වැවිලි සමාගමට අයත් ගෝනකැලේ වත්තේ ඉහළ කොටසේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය ඉදි කිරීමේ ව්‍යාපෘතිය**



පිරිවැය: - රු: 726,540.76

ව්‍යාපෘතියේ ආරම්භය: - 2015.01.06

ව්‍යාපෘතියේ අවසානය: 2015..07.09

### 6.2.5 ඉන්දියානු රජයේ ආධාර සහිතව ළමා සංවර්ධන මධ්‍යස්ථාන 70 ක් ඉදිකිරීම

නුවරඑළිය, හැටන්, මහනුවර, කෑගල්ල, බදුල්ල, රත්නපුර හා ගාල්ල යන වැවිලි ප්‍රදේශ 7 තුළ (එක් ප්‍රදේශයකට 10 බැගින්) ළමා සංවර්ධන මධ්‍යස්ථාන 70ක් ඉදිකිරීම සඳහා 2014 වසරේදී අනුමැතිය ලබා දී ඇත. ඒ යටතේ 2015 දෙසැම්බර් මස අග වනවිට සම්පූර්ණයෙන් වැඩ නිමකර ඇති ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව 21 කි.

11 වන වගුව: ළමා සංවර්ධන මධ්‍යස්ථාන 70 ඉදිකිරීමේ ප්‍රගතිය

| ප්‍රගතිය | ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව | ව්‍යාපෘති සංඛ්‍යාව - (වැ.මා.සං. භාරයේ, ප්‍රාදේශීය කාර්යාල මට්ටමින්) | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | නුවරඑළිය | හැටන් | රත්නපුර | ගාල්ල | කෑගල්ල | බදුල්ල | මහනුවර |
| සම්පූර්ණයෙන් නිමකළ | 21 | - | 10 | 1 | - | - | - | 10 |
| ක්‍රියාත්මක කිරීමේ විවිධ අදියරවල | 21 | 6 | - | 2 | 4 | 4 | 5 | - |
| මූලික අදියරවල | 28 | 4 | - | 7 | 6 | 6 | 5 | - |
| එකතුව | 70 | 10 | 10 | 10 | 10 | 10 | 10 | 10 |


## 6.3 පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධනය

වැවිලි ප්‍රජාව වාසය කරන වඩාත් පසුගාමී ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ හා ඔවුන්ගේ සුභසාධන අවශ්‍යතා ඉහළ තලයකට නැංවීමේ පරමාර්ථයෙන් යුතුව විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති මෙම වැඩසටහන යටතේ ක්‍රියාවට නැංවේ. ඒ අනුව ප්‍රවේශ මාර්ග ඉදිකිරීම, විදුලිය හා සෞඛ්‍යාරක්ෂක පහසුකම් සැපයීම, අධ්‍යාපන හා ක්‍රීඩා පහසුකම් සැපයීම, ආගමික හා සංස්කෘතික පහසුකම් සැපයීම, දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් වැනි විවිධ ප්‍රජා සංවර්ධන වැඩසටහන් අමාත්‍යාංශය, වතු සේවක නිවාස සමුපකාර සමිති, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පළාත් පාලන ආයතන හරහා සිදු කර ඇත.

### 6.3.1 ප්‍රවේශ මාර්ග ඉදි කිරීම හා වැඩි දියුණු කිරීම

වැවිලි ප්‍රජාව හා ග්‍රාමීය ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ග්‍රාමීය ප්‍රවේශ මාර්ග ඉදි කිරීම හා පිළිසකර කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කෙරේ. විශේෂයෙන්ම නිසි ප්‍රවේශ මාර්ග නොමැති වතු ප්‍රජාව වෙත නව ප්‍රවේශ මාර්ගයන්, අඩිපාරවල්, පඩිපෙලවල් මෙන්ම කාණු පද්ධති සැකසීමද සිදු කරන ලදී. මේ යටතේ 2015 වර්ෂයේදී ව්‍යාපෘති 110 ක් ක්‍රියාත්මක කරන ලද අතර වර්ෂය අවසාන වන විට ඉන් ව්‍යාපෘති 90 ක් අවසන් කර ඇත. ඉතිරි ව්‍යාපෘති 20 කඩිනමින් අවසන් කිරීමට පියවර ගෙන ඇත. 2015.12.31 දින වනවිට දරා ඇති පිරිවැය රුඃ මිඃ 39 කි.

3 ප්‍රස්ථාරය: ප්‍රවේශ මාර්ග ඉදි කිරීම / වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කල ව්‍යාපෘති වල ප්‍රගතිය



**5 වන රූප සටහන:** මහනුවර ප්‍රාදේශීය කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද උඩ පුස්සැල්ලාව වැවිලි සමාගමට අයත් මඩුල්කැලේ වතුයායේ ඉහල කොටසේ මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය




**පිරිවැය: -** රුඃ 2,684,403.25

**ව්‍යාපෘතියේ ආරම්භය: - 2014**

**ව්‍යාපෘතියේ අවසානය:** 2015

## 6.3.2 අධ්‍යාපන හා ක්‍රීඩා පහසුකම් වැඩි දියුණු කිරීම

විශේෂයෙන්ම වැවිලි ප්‍රදේශයන්හි හා ග්‍රාමීය ප්‍රදේශයන්හි වෙසෙන දරු දැරියන්ගේ අධ්‍යාපනය හා ක්‍රීඩා හැකියාවන් නැංවීමේ අරමුණින් ව්‍යාපෘති ගණනාවක් මෙම අමාත්‍යාංශය මගින් දියත් කරන ලදී. පාසල් ගොඩනැගිලි ඉදිකිරීම, විද්‍යාගාර ඉදිකිරීම හා විද්‍යාගාර පහසුකම් ලබාදීම, අධ්‍යාපන උපකරණ ලබාදීම ආදිය මෙන්ම ක්‍රීඩා පහසුකම් දියුණු කිරීම යටතේ ක්‍රීඩාගාර ඉදි කිරීම, ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම, ක්‍රීඩා භාණ්ඩ ලබාදීම ආදිය මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කර ඇති අතර 2015 දෙසැම්බර් මස අග වනවිට දරන ලද පිරිවැය රුඃ මිලියන 34 කි.

**6 වන රූප සටහන:** බඹරකැලේ වතුයායේ වොලි බෝල් ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය නුවරඑළිය



**පිරිවැය: -** රුඃ1,275,546.25

**ව්‍යාපෘතියේ ආරම්භය: -** 2014

**ව්‍යාපෘතියේ අවසානය:** 2015

**ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව** - 350

**12 වන වගුව:** අධ්‍යාපන හා ක්‍රීඩා පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කල විවිධ ව්‍යාපෘති පිළිබඳ ප්‍රගතිය

| ක්‍රියාත්ම කල විවිධ ව්‍යාපෘති වල භෞතික ප්‍රගතිය | අධ්‍යාපන පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සංඛ්‍යාව | ක්‍රීඩා පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|
| 100 % ක් නිමකළ | 31 | 23 |
| 50% - 75% | 03 | - |
| 25% - 50% | 07 | 02 |
| 0%- 25% | 17 | 04 |
| එකතුව | 58 | 29 |

### 6.3.3 ආගමික හා සංස්කෘතික පහසුකම් සැපයීම

පුද්ගලයින් අතර ආගමික සහජීවනය, සදාචාරය හා අන්‍යොන්‍ය සහයෝගිතාව වර්ධනය කිරීමේ අරමුණින් මෙම අමාත්‍යාංශය විසින් විවිධ ආගමික හා සංස්කෘතික පහසුකම් සැපයීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ආගමික මධ්‍යස්ථාන හා සංස්කෘතික මධ්‍යස්ථාන ඉදි කිරීම, වැඩි දියුණු කිරීම විවිධ ආගමික හා සංස්කෘතික වැඩසටහන් වලට දායකත්වය ලබාදීම ආදිය සිදු කරන ලදී. මේ අනුව මේ යටතේ ව්‍යාපෘති 57 ක් ක්‍රියාවට නංවන ලද අතර රුː මිලියන 16 ක පිරිවැයක් දරමින් වර්ෂය අවසන් වන විට ව්‍යාපෘති 31 ක් අවසන් කර ඇත.

**13 වන වගුව: ආගමික හා සංස්කෘතික පහසුකම් සැපයීම සඳහා ක්‍රියාත්මක කල විවිධ ව්‍යාපෘති පිළිබඳ ප්‍රගතිය**

| ක්‍රියාත්මක කල විවිධ ව්‍යාපෘති වල භෞතික ප්‍රගතිය | ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|
| 100 % ක් නිමකළ | 31 |
| 50% - 75% | 02 |
| 25% - 50% | 07 |
| 0%- 25% | 17 |
| එකතුව | 57 |

**7 වන රූප සටහන :**

බදුල්ල ප්‍රාදේශීය කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද බල්ලකැටුව සංස්කෘතික මධ්‍යස්ථානය ඉදි කිරීමේ ව්‍යාපෘතිය




පිරිවැය: - රුː 8,715.032.43
ව්‍යාපෘතියේ ආරම්භය: - 2014.11.12
ව්‍යාපෘතියේ අවසානය: 2015.01.29
ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව - 1000

### 6.3.4 විශේෂ ව්‍යාපෘති හා පොදු පහසුකම් සැපයීම

විශේෂයෙන්ම වැවිලි ප්‍රජාවගේ පොදු ජන ජීවිතය උදෙසා විවිධ ක්‍රියාකාරකම් හි නියැලීමට ඇවැසි පොදු කටයුතු උදෙසා පහසුකම් සැපයීම මේ යටතේ සිදු කරන ලදී. පුද්ගලයින් අතර සුහදශීලීත්වය හා අන්‍යොන්‍ය සබඳතාව වර්ධනය මෙන්ම වැවිලි ප්‍රජාව තවදුරටත් හුදකලා නොවූ ජන කොටසක් ලෙස සමාජ ගත කිරීමේ අරමුණින් ඒ සඳහා ඇවැසි සහයෝගය ලබා දීම මේ යටතේ සිදු කරන ලදී. ඒ අනුව සුභ සාධන සංගම් වෙත කූඩාරම්, මඩු, තාවකාලික මඩු හා පුටු ආදිය ලබා දීම සිදු කරන ලදී. එමෙන්ම විවිධ ආගමික හා සංස්කෘතික දිනයන් මුල් කරගනිමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමද සිදු කරන ලදී. මේ සඳහා 2015 වර්ෂය තුලදී දරා ඇති මුළු පිරිවැය රුː මිː 25 කි.

## 14 වන වගුව: ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධන කටයුතුවල සමස්ථ ප්‍රගතිය
(2013/2014 වර්ෂ වල අවිච්ඡේද වැඩසටහන් ද ඇතුළුව)

| ක්‍රියාත්මක කිරීමේ ආයතනය | වහල නැවත සෙවිලි කිරීම් | | ජල සම්පාදන ව්‍යාපෘති | | වැසිකිළි ඉදිකිරීම් | | ළමා සංවර්ධන මධ්‍යස්ථාන | | ප්‍රවේශ මාර්ග | | වෙනත් කටයුතු * | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඒකක සංඛ්‍යාව | බෙදා හරින ලද තහඩු සංඛ්‍යාව | ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | ඒකක සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | ඒකක සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | ව්‍යාපෘති /ඒකක සංඛ්‍යාව | නිම කළ සංඛ්‍යාව | ක්‍රියාත්මක කළ ව්‍යාපෘති / ඒකක සංඛ්‍යාව | 2015 දී නිමකළ සංඛ්‍යාව |
| වැවිලි මානව සංවර්ධන භාරය | 825 | 825 | 30 | 27 | 740 | 666 | 91 | 41 | 28 | 12 | 42 | 38 | 1756 | 1609 |
| දි.ලේ./ප්‍රා.ලේ.කා./ ම.න.ස./ ප්‍රා.ස./ අමාත්‍යාංශය | - | - | 100 | 81 | - | - | 5 | 5 | 120 | 84 | 583 | 550 | 808 | 720 |
| එකතුව | 825 | 825 | 130 | 108 | 740 | 666 | 96 | 46 | 148 | 96 | 625 | 588 | 2564 | 2329 |

* වෙනත් කටයුතු : ආගමික හා සංස්කෘතික, අධ්‍යාපනික, ක්‍රීඩා සංවර්ධන, පොදු පහසුකම් හා විශේෂ කටයුතු
දි.ලේ/ප්‍රා.ලේ.කා.- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ම.න.ස. -මහනගර සභා, ප්‍රා.ස. - ප්‍රාදේශීය සභා

## 7. අමාත්‍යාංශය විසින් අත්පත් කරගන්නා ලද විශේෂ ජයග්‍රහණ

### 7.1 වැවිලි ප්‍රජාවගේ සමාජ සංවර්ධනය සඳහා වන පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම

2016 සිට 2025 දක්වා දස අවුරුදු කාල පරිච්ඡේදයක් ආවරණය වන පරිදි අදාල පාර්ශ්වකාර ක්ෂේත්‍රයන්ගෙන් ද පුළුල් ලෙස තොරතුරු ලබාගනිමින්, වැවිලි ප්‍රජාවගේ සමාජ සංවර්ධනය සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්මක් අමාත්‍යාංශය විසින් සකසන ලදී. කෙසේ වුවද මෙය කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව සලකා අමාත්‍ය මණ්ඩලය විසින් මෙය පස් අවුරුද්දක් තුල නිම කිරීමට හැකි වන පරිදි නැවත සංශෝධනය කරන ලෙස උපදෙස් ලබා දී ඇත. ඒ අනුව පත් කරන ලද 2015.12.17 දින රැස්වූ විශේෂ කමිටුවකින් මෙය කාර්තුමය ප්‍රගති සමාලෝචනයන්ද සිදු කරමින් වසර 5ක් තුල ක්‍රියාත්මක කිරීමට හැකි වන අයුරින් සකසන ලදී. මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි පරමාර්ථ පහත දැක්වේ.

- වැවිලි අංශයේ දරිද්‍රතා මට්ටම අවම කිරීම, ජීවන මට්ටම නගා සිටුවීම සහ සමාජ හා ආර්ථික අයිතිවාසිකම් වැවිලි අංශයේ ජනතාවට ද භුක්ති විඳිය හැකිවීම
- වැවිලි අංශයේ ජනතාව විසින් මුහුණදෙනු ලබන සමාජ පරතර හා ගැටලු නිරාකරණය කිරීම
- වැවිලි අංශයේ ප්‍රජාව වෙසෙන ප්‍රදේශ තුළ සහශ්‍ර සංවර්ධන ඉලක්ක හා තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම
- උපාය මාර්ග, මැදිහත්වීම් සහ සම්පත් බෙදාහැරීමේ වැඩපිළිවෙලයන්හි ප්‍රමුඛතාව හඳුනා ගැනීම

වැවිලි අංශය තුළ වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා වන කඩිනම් හා කාලීන අවශ්‍යතාවක් ලෙස මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැලකෙන අතර, යථෝක්ත කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා වන විවිධ සංවර්ධන කටයුතු ද මෙම සැලසුම තුළින් හඳුනාගනු ලැබ ඇත.

### 7.2 වැවිලි ප්‍රජාවගේ ජන ජීවිත අභිමානය නැංවීම සඳහා යෝග්‍ය නිවාස තනා ඒවායේ අයිතිය හිමිකර දීම

වැවිලි ප්‍රජාව අභිමානයකින් යුතුව ජීවත් වීමට පර්චස් 7 ක ඉඩම් අයිතිය ද සමග වර්ග අඩි 550 ක ප්‍රමාණයේ තනි නිවාස රජයේ ප්‍රතිපත්තියක් අනුව ලබාදීමට අදාල අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ජල සැපයුම, සනීපාරක්ෂාව, ප්‍රවේශ මාර්ග, විදුලිය, ප්‍රජා මධ්‍යස්ථාන,ළමා සංවර්ධන මධ්‍යස්ථාන, ආගමික මධ්‍යස්ථාන හා අනෙකුත් පොදු පහසුකම් සහිත ගම්මාන සංකල්පයකින් යුත් නිවාස වැඩ සටහනක් මේ යටතේ ක්‍රියාත්මක කෙරේ. ලයින් කාමරවල පදිංචිව සිටින්නන් සහ නායයාමෙන් පීඩිත වූවන් සඳහා නිවාස වැඩසටහන් දෙකක් වෙන් වෙන් වශයෙන් සකසා ක්‍රියාවට නංවා ඇත. මෙම දේපළවල සම අයිතිය කලත්‍රයන් දෙදෙනාටම ලැබෙන පරිදි ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බල ගැන්වීමද සැපිරෙන අයුරින් මූලික වශයෙන් ඒවායේ අයිතිය පිළිබඳ ප්‍රකාශිත

බලපත්‍ර නිකුත් කර, අවසානයේදී ඒවායේ හිමිකම් ඔප්පු ලබාදීම සඳහා අමාත්‍යාංශය සහ වැවිලි මානව සංවර්ධන භාරය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත සිය සහාය සලසා ඇත.

මෙම කාර්යයට මුල පුරමින් 2015 මැයි මස 10 වන දින තලවකැලේ දී නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්ක වලින් තෝරාගත් පවුල් 230 කට බලපත්‍ර ලබා දී ඇති අතර මෙතෙක් බලපත්‍ර ලබා දී ඇති පවුල් සංඛ්‍යාව 1098 කි.

## 7.3 වැවිලි අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා විදෙස් අරමුදල්

ලෝක බැංකු සහාය ඇතිව අමාත්‍යාංශය යටතේ, 2015 සැප්තැම්බර් / ඔක්තෝම්බර් මාසයන් හි අරඹන ලද ව්‍යාපෘති 2 කි.

- **ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය**

  මෙම ව්‍යාපෘතියේ මූලික කටයුතු 2015 සැප්තැම්බර් / ඔක්තෝබර් කාල පරිච්ඡේදය තුළ ආරම්භ කරන ලද අතර, වසර 2020 දී නිමාවට පත්කිරීමට නියමිතය. නුවරඑළිය සහ හැටන් හි තෝරාගත් ප්‍රදේශ මෙම ව්‍යාපෘතිය මගින් ආවරණය වේ. මෙම ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ අතර, ජල සම්පාදන ව්‍යාපෘති 150 ක් පමණ අන්තර්ගත වන අතර, එමගින් පවුල් 22,000 කට ප්‍රතිලාභ අත්වනු ඇත. තවද වැවිලි අංශයේ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා වැසිකිළි 12,000 ක් ඉදිකිරීමට ද ප්‍රතිපාදන සලසයි. ලෝක බැංකුව සමග අදාළ ව්‍යාපෘති ගිවිසුම අත්සන් කිරීමේ කටයුතු සිදු කෙරෙන අතර, තෝරා ගැනීමේ නිර්ණායක මත පදනම්ව අදාළ ව්‍යාපෘති හඳුනාගැනීමේ කටයුතු මේ වනවිට සිදු කෙරෙමින් පවතී. මේ සඳහා වැය වන ඇස්තමේන්තු ගත පිරිවැය ඇ.ඩො.මි. 14 ක් වේ.

- **පූර්ව ළමා සංවර්ධන ව්‍යාපෘතිය**

  මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වනුයේ වැවිලි ප්‍රදේශවල ජීවත්වන අවුරුදු 3 සහ 5 අතර දරු දැරියන්ගේ ළමාරක්ෂක කටයුතු ප්‍රමාණාත්මකව හා ගුණාත්මක වශයෙන් දියුණු කිරීමයි. මෙහි ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩො.මි. 10 ක් වේ. මෙම ව්‍යාපෘතිය 2015 ඔක්තෝබර් මස ආරම්භ කරන ලද කරන ලද අතර 2020 දී නිමවනු ඇත. ගොඩනැගිලි, ක්‍රීඩා පිටි සහ ඒ සඳහා උපකරණ ද සහිතව ඉදිකිරීමට අපේක්ෂිත නව ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව 140 කි. දැනටමත් වැවිලි ප්‍රදේශ තුළ පිහිටා ඇති වැඩිදියුණු කිරීමට නියමිත ළමා සංවර්ධන මධ්‍යස්ථාන (සී සහ ඩී ශ්‍රේණි වල)සංඛ්‍යාව 175 කි. අවශ්‍ය උපකරණ ද සහිතව ඉදිකිරීමට නියමිත නව ක්‍රිඩා පිටි සංඛ්‍යාව 175 ක් වන අතර දැනට ඉදිකර ඇති ක්‍රීඩා පිටි හා ඒවාට අවශ්‍ය උපකරණ ද සහිතව නවීකරණය සිදුකරන ක්‍රීඩාපිටි සංඛ්‍යාව 210 කි. මෙම ව්‍යාපෘතියට ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල ගුරුවරුන් සඳහා ඩිප්ලෝමා පාඨමාලා ද, නව දැනුම ලබාදීමේ පුහුණු වැඩසටහන් ද, දෙමව්පියන් දැනුවත් කිරීමේ වැඩසටහන් ද ඇතුළත් වේ. නව ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා සුදුසු ස්ථාන තෝරාගැනීමේ කටයුතු මේ වන විට සිදුකෙරෙමින් පවතී.

- **ඉන්දියානු ප්‍රදාන යටතේ ක්‍රියාත්මක වන නිවාස වැඩසටහන**

ඉන්දියාවේ ගරු අග්‍රාමාත්‍ය තුමා ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර, නව නිවාස 20,000 ක් ඉදිකිරීමටත්, දැනට පවත්නා නිවාස (ලයින් කාමර) 30,000 ක් වැඩිදියුණු කිරීමටත් අතිරේක ප්‍රතිපාදන ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, මෙම ව්‍යාපෘතිය ඉන්දීය රජයේ ආධාර ලබා ගැනීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.

# 8. අමාත්‍යාංශ විෂය පථය යටතේ ගැනෙන ආයතනවල ප්‍රගතිය

*(2015 දෙසැම්බර් මස 31 වන දිනට)*

## 8.1 වැවිලි මානව සංවර්ධන භාරය

### 8.1.1 පසුබිම

වැවිලි මානව සංවර්ධන භාරය වැවිලි අංශයේ වෙසෙන ජනතාවගේ ජීවනෝපාය මාර්ග වැඩිදියුණු කිරීම උදෙසා ප්‍රථමයෙන් "වතු නිවාස හා සමාජ සංවර්ධන භාරය" යනුවෙන් වූ ආයතනයක් නමින් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 1992 සැප්තැම්බර් මස 18 වන දින සංස්ථාපිත කරන ලද සමාගමකි. මෙම ආයතනය පසුව 2002 ඔක්තෝබර් මස 25 වන දින ''වැවිලි මානව සංවර්ධන භාරය'' ලෙස ප්‍රතිනාම ගත කෙරුණි. මේ වන විට මෙම භාරය 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරනු ලැබ තිබේ.

යථෝක්ත ඉලක්ක සාක්සාත් කරගනු පිණිස වැවිලි මානව සංවර්ධන භාරය මගින් පහත දැක්වෙන කටයුතු ක්‍රියාත්මක කරයි.

- වතු ප්‍රජාවේ ලයින් කාමර වෙනුවට ස්වයං අයිතිය සතු තනි නිවාස සුදුසු පුද්ගලයන් වෙත ලබාදීම
- පැරණි ලයින් කාමර නිවාස අලුත්වැඩියා කිරීම හා ඒවායේ වහලවල් නැවත සෙවිලි කිරීම (re-roofing)
- ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් ප්‍රවර්ධනය කිරීම
- ළමා සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම හා සුදුසුකම් ලත් ළමා සංවර්ධන නිලධාරීන් හඳුන්වාදීම.
- ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (මාර්ග / ගොඩනැගිලි /ආගමික මධ්‍යස්ථාන යනාදිය)
- සෞඛ්‍ය පහසුකම් ලබාදීම හා සමාජ සංවර්ධන කටයුතු
- අලෙවි පහසුකම් කටයුතු සලසා දීම

### 8.1.2 සම්බන්ධිත ආයතන හා සංවිධාන ව්‍යුහය

වැවිලි මානව සංවර්ධන භාරය, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. මෙය, වැවිලි අංශයේ දස ලක්ෂයකට අධික ජනතාවකගේ ජීවන තත්ත්වය නගා සිටුවීම පිණිස වැඩසටහන් සම්බන්ධීකරණය කරමින්, ඊට අවශ්‍ය පහසුකම් සලසාදීම උදෙසා ක්‍රියාකරන, ශ්‍රී ලංකා රජය, ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ වතු අංශයේ වෘත්තීය සමිතිවලින් සමන්විත ත්‍රෛයිපාර්ශවික සංවිධානයකි.

වැවිලි මානව සංවර්ධන භාරය වතු කම්කරුවන්ගේ යහපත උදෙසා යටිතල හා සමාජ සංවර්ධන වැඩසටහන් රැසක් මෙහෙයවීමෙහිලා රජයේ අදාළ අමාත්‍යාංශ, වෘත්තීය සමිති, ප්‍රාදේශීය වැවිලි සමාගම්, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා වෙනත් දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය හා පුද්ගලික ආයතන සමග සහයෝගිතාවයෙන් යුතුව කටයුතු කරයි.

ගරු අමාත්‍යතුමා විසින් පත්කරනු ලබන සභාපතිවරයෙකු සහ ශ්‍රී ලංකා රජය, ප්‍රාදේශීය වැවිලි සමාගම් හා වෘත්තීය සමිති නියෝජිතයන්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ වැවිලි මානව සංවර්ධන භාරය ක්‍රියාත්මක වේ. මෙහි කළමනාකරණයේ ප්‍රධානත්වය ගෙන කටයුතු කරනුයේ අධ්‍යක්ෂ ජනරාල්වරයෙකි. අභ්‍යන්තර අධ්‍යක්ෂවරුන්ද අංශ ප්‍රධානීන් හා බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලයට අනුබද්ධ කාර්ය මණ්ඩලය ද ඔහුට සහාය වේ. ගාල්ල, රත්නපුර, බදුල්ල, කෑගල්ල, මහනුවර, හැටන් සහ නුවරඑළිය යන ස්ථානවල පිහිටි ප්‍රාදේශීය කාර්යාල හතක් මගින් ප්‍රධාන කාර්යාලයේ කටයුතු ශක්තිමත් කෙරේ. ප්‍රාදේශීය අධ්‍යක්ෂවරයා අදාළ ප්‍රදේශිය කාර්යාලයේ ප්‍රධානියා වන අතර, තාක්ෂණික, මූල්‍ය හා කළමනාකරණ කාර්ය මණ්ඩලය ඔහුට සහාය සලසයි.

**08 වන රූප සටහන: වැවිලි මානව සංවර්ධන භාරයේ ප්‍රාදේශීය ව්‍යුහය.**



### 8.1.3 වතු සේවක නිවාස සමූපකාර සමිති මගින් මෙහෙයවනු ලබන විශේෂ වැඩසටහන්

වතු සේවක නිවාස සමූපකාර සමිති, සමූපකාර දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව 1993 දී පිහිටුවන ලදී. මූලික වශයෙන් නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවන ලද මෙම සමිති, මේ වනවිට ප්‍රාදේශීය වැවිලි සමාගම් මගින් පාලනය වන වතුයායවල් 435 ක් ආශ්‍රිතව ක්‍රියාත්මක වේ.

දැනට වතු සේවක නිවාස සමූපකාර සමිති 418 ක් දිවයින තුළ (ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ රජය විසින් පාලනය කරනු ලබන සමාගම් සම්බන්ධිතව) පිහිටුවා ඇත. දැඩි අනුග්‍රහයක් පවතින ප්‍රාදේශීය වැවිලි සමාගම් වල වතුයායවල් ආශ්‍රිතව පිහිටුවා ඇති මෙම සමූපකාර සමිති බොහොමයක්, ප්‍රමුඛ ප්‍රජා මූල සංවිධාන ලෙස රට තුළ ස්ථාපනය වී ඇත. ඒවා වැවිලි මානව සංවර්ධන භාරයේ ප්‍රාදේශීය කාර්යාල වල අධීක්ෂණය යටතේ නිර්ණායක මත පදනම් වූ ඉහළ ශ්‍රේණිගත කිරීම් වලට ලක් කර ඇති අතර, ඒවායේ නිරන්තර සුපරීක්ෂාවට භාජනය වේ.

මෙම සමිති "වතු සේවක නිවාස සමූපකාර සමිති (වනිස) බැංකුව" යන නමින් ඔවුන්ගේම බැංකු හරහා සිය අරමුදල් උපදවාගනු ලබන අතර, ණය මුදල් සපයා දීමට ද කටයුතු කරයි.

ණය සැපයීමට අමතරව රැකියා අවස්ථා ද උදා කරමින් වතුවල පදිංචි නිවැසියන් හට ඔවුන්ගේ සේවා අවශ්‍යතා සඳහා පහසු ප්‍රවේශයක් සලසා දෙමින් වතු සේවක නිවාස, සමූපකාර සමිති, සිල්ලර භාණ්ඩ / ශුභසාධන වෙළඳසැල්, බාබර් සැලුන් හා සන්නිවේදන මධ්‍යස්ථාන යනාදී ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමටද පහසුකම් සලසා ඇත. වතු නිවැසියන්ගේ ජීවන තත්ත්වය, ඔවුන්ගේ සෞඛ්‍ය, පෝෂණය, සනීපාරක්ෂාව හා පවිත්‍රතාව යනාදිය ඉහළ නැංවීම පිණිස ඔවුනට අවශ්‍ය වන භාණ්ඩ හා සේවා පහසුවෙන් ඔවුන් වෙත ළඟාකර දීම සඳහා වතු සේවක නිවාස සමූපකාර සමිති තම උප නියෝජිතයන් ලෙස යොදාගනිමින්, වැවිලි මානව සංවර්ධන භාරය විසින් බහු ජාතික සමාගම් සහ වෙනත් ප්‍රමුඛ පෞද්ගලික අංශයේ සංවිධාන සමග ද ඒකාබද්ධව කටයුතු කරයි.

වතු සේවක නිවාස සමූපකාර සමිතිවල සහභාගිත්වය ඇතිව වැවිලි මානව සංවර්ධන භාරය විසින් පහත දැක්වෙන ජාතික මට්ටමේ වැඩසටහන් ද සිදු කරනු ලබයි.

- **සහල් පිටිවලින් සැකසූ ගුණදායී ආහාරː**

  රටේ ඉහළම තිරිඟු පිටි පරිභෝජනය සිදුවනුයේ වැවිලි අංශය තුළය. එබැවින්, රජය විසින් ස්වකීය සම්ප්‍රදායික ආහාරපාන ගුණාදායී ලෙස සාද ගැනීමේ විකල්පයක් ලෙස විශේෂ සහල් පිටි මිශ්‍රණයක් හඳුන්වාදී ඒ සඳහා වැවිලි ප්‍රජාව දිරිමත් කිරීමට කටයුතු කරමින් පවතී. මේ වන විට සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ඇති වතු සේවක නිවාස සමූපකාර සමිති ජාලය හරහා, නව බෙදා හරින්නකු මගින්, මෙම මිශ්‍රණය වතු ප්‍රජාව තුල ප්‍රචලිත කිරීමට පියවර ගෙන ඇත. වැවිලි ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාලන මෙම සමිති ජාලය පවත්වාගෙන යාම සඳහා මෙමගින් සැලකිය යුතු ආදායමක්ද උපයා ගැනේ.

- **ගෑස් භාවිත කර වඩාත් පිරිසිදුව හා ආරක්ෂාකාරීව ආහාර පිසීම:**

ඉවුම් පිහුම්, දරුවන් රැක බලාගැනීම් හා පවුලේ අනෙකුත් සියලු කටයුතු වල නිරත වෙමින් දවස පුරා ක්ෂේත්‍රයේ නියැලුන රැකියාවක යෙදීම හේතුවෙන් වැවිලි ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන්ට දුෂ්කරතා රැසකට මුහුණ පෑමට සිදුව ඇති අතර, ඉවුම් පිහුම් සඳහා දර භාවිත කිරීමේ හේතුවෙන් දෛනික රැකියාවට පවා එය බාධාවක් වී ඇත. විශේෂයෙන් දර භාවිතා කිරීම නිසා ඇතිවන දුම් ශරීරගත වීම හේතුවෙන් ඇතිවන අහිතකර තත්ත්වයන් හා සෞඛ්‍ය ගැටළු මග හරවා වැවිලි ක්ෂේත්‍රයේ ජනතාවගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් හා වන විනාශය අඩුකර ගැනීම, පරිසර දූෂණය හා කාබන් විමෝචනය අවම කිරීම වැනි කරුණු මුල් කරගෙන දර වෙනුවට ගෑස් භාවිතය ප්‍රචලිත කිරීමේ අරමුණින් වැවිලි මානව සංවර්ධන භාරය, ලාෆ්ස් ගෑස් සමාගම හා එක්ව "වතු ප්‍රජා දිවි නැගුම" නමැති ව්‍යාපෘතිය දියත් කරන ලදී.

මෙම ව්‍යාපෘතිය මගින්, වතු සේවක සමිති ජාලය සම්බන්ධ කරගනිමින්, සහනදායී මිලක් යටතේ පහසු ගෙවීමේ ක්‍රමයට ගෑස් සිලින්ඩර් සමග ගෑස් උදුන් හා උපාංග ලබාදීම සිදු කෙරේ. එමගින්, ගෑස් භාවිතය ප්‍රචලිත වී ඇති අතර කාන්තාවන් සේවයට වාර්තා කිරීමේ ප්‍රගතියක්ද දක්නට ඇත. එමෙන්ම, දර භාවිතය අවම වී පරිසරය ආරක්ෂා වීමටද මෙම ව්‍යාපෘතිය ඉවහල් වී ඇත. දැනට වතුයායවල් 342 ක පමණ ගෑස් උදුන් භාවිතය ක්‍රියාත්මක වේ. ඒ තුලින් වතු සේවක නිවාස සමූපකාර සමිති ජාලය 2015 වර්ෂයේදී රු.මි. 6.2 ක ලාභයක් උපයාගෙන ඇති අතර එහි මෙහෙයුම් වියදම් දරමින් මෙම ජාලය තිරසාරව පවත්වා ගැනීමට එය උපකාරී වී ඇත.

මෙම ව්‍යාපෘතිය, 2014 වසරේදී කොළඹදී හා 2015 වසරේදි සිංගප්පූරුවේදී පවත්වන ලද ලෝක LPG සමුළු සඳහා ද ඉදිරිපත් කර ඇත.

- **වතු ප්‍රජා රුව සුව සේවාව:**

ප්‍රථම වතාවට, බහු ජාතික සමාගමක් වන යුනිලීවර් සමාගම හා එක්ව "වතු ප්‍රජා රුව සුව සේවාව" නමින් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. එතුලින් වතු සේවක නිවාස සමූපකාර සමිති වෙළෙඳසැල් හා සුභසාධන මධ්‍යස්ථාන හරහා එම සමාගම විසින් නිෂ්පාදනය කරනු ලබන සියලු ආහාර පාන වර්ග හා අනෙකුත් සෞඛ්‍ය ආරක්ෂිත භාණ්ඩ ලබා ගැනීමේ හැකියාව වැවිලි ප්‍රජාව වෙත හිමිවී ඇත.

එමෙන්ම මෙම සමාගම විසින් වාර්ෂිකව සිදු කරනු ලබන සෞඛ්‍ය හා සුරක්ෂිතතාව වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් වන සියලු ජාතික වැඩසටහන්හි ප්‍රතිලාභ අත්පත් කර ගැනීමේ අවස්ථාව විශේෂයෙන් මව්වරුන්ට හා දරු දැරියන්ටද, වැවිලි ප්‍රජාව වෙත ද හිමි වි ඇත. තවද ස්වස්ථතාව, පෝෂණය හා යහපත් සෞඛ්‍ය පුරුදු පිළිපැදීම සම්බන්ධයෙන් මුළු වැවිලි ප්‍රජාව වෙතද ප්‍රතිලාභ හිමිවී ඇත.

මීට අමතරව “Sustainable Living Plan” නමින් ව්‍යාපෘතියක් 2015 වර්ෂය අවසානයේදී ආරම්භ කරන ලද අතර පරිසර සංරක්ෂණය, ළමා සංවර්ධන මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම, ළමා මුඛ සෞඛ්‍ය රැක ගැනීම යානාදී වශයෙන් වතු ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම මූලික කරගත් විවිධ වැඩසටහන් ඊට ඇතුලත් කර ඇත. මේ යටතේ වතු ප්‍රදේශ දෙකක් කේන්ද්‍ර කර ගනිමින් ළමුන් 290ක් සඳහා මුඛ සෞඛ්‍ය දියුණු කිරීම් වැඩසටහන් 2015 වසර අග භාගයේදී ක්‍රියාත්මක කරන ලදී.

ඉහත කරුණුවලට අමතරව මෙම සේවා ජාලයේ සවිමත් මූල්‍ය කළමණාකරණය හා යහපාලනය සහතික කෙරෙනු පිණිස සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අදළ වතු සේවක නිවාස සමූපකාර සමිති වාර්ෂික විගණනයට ලක් කෙරේ. තවද, වතු සේවක නිවාස සමූපකාර සමිතිවලට අයත් කාර්ය මණ්ඩලයේ සහ ප්‍රජා නායකයන්ගේ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් යුතුව “වනිස” අරමුදල, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව හා රාජ්‍ය නොවන සංවිධාන යනාදී ආයතන වෙතින් ලද ප්‍රතිපාදන යොදා ගනිමින්, වැවිලි මානව සංවර්ධන භාරය විසින් ඔවුන් සඳහා පුහුණු හා සංවර්ධන වැඩසටහන්ද පවත්වා ඇත.

### 8.1.4 අමාත්‍යාංශය සැපයූ අරමුදල් යටතේ වැවිලි මානව සංවර්ධන භාරය විසින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

**15 වන වගුව: 2013/2014 අවිච්ඡේද වැඩසටහන් - වැවිලි මානව සංවර්ධන භාරයේ ප්‍රගතිය (ප්‍රදේශීය මට්ටමින්)**

| වැවිලි මානව සංවර්ධන භාර ප්‍රදේශය | නිවාස ඉදිකිරීම් | | ජල සම්පාදන ව්‍යාපෘති | | වැසිකිළි ඉදිකිරීම් | | ළමා සංර්ධන මධ්‍යස්ථාන | | ප්‍රවේශ මාර්ග | | වෙනත් කටයුතු * | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඒකක සංඛ්‍යාව | ගිම කළ සංඛ්‍යාව | ව්‍යාපෘති සංඛ්‍යාව | ගිමකළ සංඛ්‍යාව | ඒකක සංඛ්‍යාව | ගිමකළ සංඛ්‍යාව | ඒකක සංඛ්‍යාව | ගිමකළ සංඛ්‍යාව | ව්‍යාපෘති සංඛ්‍යාව | ගිමකළ සංඛ්‍යාව | ව්‍යාපෘති / ඒකක සංඛ්‍යාව | ගිම කළ සංඛ්‍යාව | ක්‍රියාත්මක කළ ව්‍යාපෘති / ඒකක සංඛ්‍යාව | 2015 දී ගිමකළ සංඛ්‍යාව |
| නුවරඑළිය | 203 | - | 02 | 01 | - | - | 10 | | 02 | 01 | 07 | 07 | **224** | **09** |
| හැටන් | 84 | - | - | - | - | - | 10 | 10 | 03 | 03 | 14 | 14 | **111** | **27** |
| ගාල්ල | 47 | 47 | 04 | 04 | 20 | 20 | 10 | - | - | - | 01 | 01 | **82** | **72** |
| මහනුවර | 80 | - | 01 | 01 | 10 | - | 10 | 10 | 18 | 03 | 01 | 01 | **120** | **15** |
| කෑගල්ල | 118 | 14 | 02 | 02 | - | - | 10 | - | 03 | 03 | 09 | 09 | **142** | **28** |
| රත්නපුර | 65 | - | - | - | | - | 10 | 01 | 01 | 01 | - | - | **76** | **02** |
| බදුල්ල | 20 | - | 02 | 02 | 10 | 10 | 10 | - | 01 | 01 | 10 | 10 | **53** | **23** |
| එකතුව | **617** | **61** | **11** | **10** | **40** | **30** | **70** | **21** | **28** | **12** | **42** | **42** | **808** | **176** |

**16 වන වගුව: 2015 දී අනුමත කරන ලද නව වැඩසටහන්වල / ව්‍යාපෘතිවල ප්‍රගතිය**

| වැවිලි මානව සංවර්ධන භාර ප්‍රදේශය | නිවාස ඉදිකිරීම් | | නැවත සෙවිලි කිරීම් | | ජල සම්පාදන ව්‍යාපෘති | | වැසිකිළි ඉදිකිරීම් | | ළමා සංවර්ධන මධ්‍යස්ථාන | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඒකක සංඛ්‍යාව | නිම කළ සංඛ්‍යාව | ඒකක සංඛ්‍යාව | බෙදා හරින ලද සංඛ්‍යාව | ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | ඒකක සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | ව්‍යාපෘති /ඒකක සංඛ්‍යාව | නිම කළ සංඛ්‍යාව | ක්‍රියාත්මක කළ ව්‍යාපෘති / ඒකක සංඛ්‍යාව | 2015 දී නිමකළ සංඛ්‍යාව |
| නුවරඑළිය | 147 | 97 | 123 | 123 | 04 | 03 | 100 | 100 | 03 | 03 | 377 | 326 |
| හැටන් | 62 | 62 | 100 | 100 | 03 | 03 | 125 | 61 | 03 | 03 | 293 | 229 |
| ගාල්ල | - | - | 116 | 116 | 02 | 02 | 100 | 100 | 03 | 03 | 221 | 221 |
| මහනුවර | 40 | 40 | 43 | 43 | 02 | 02 | 85 | 85 | 03 | 03 | 173 | 173 |
| කෑගල්ල | 12 | 12 | 100 | 100 | 03 | 02 | 100 | 100 | 03 | 03 | 218 | 217 |
| රත්නපුර | 30 | 30 | 119 | 119 | 02 | 02 | 90 | 90 | 03 | 03 | 244 | 244 |
| බදුල්ල | 47 | 47 | 99 | 99 | 03 | 03 | 100 | 100 | 03 | 02 | 252 | 251 |
| එකතුව | **338** | **288** | **700** | **700** | **19** | **17** | **700** | **636** | **21** | **20** | **1778** | **1661** |

**17 වන වගුව: 2015 දී අනුමත කරන ලද පානීය ජල සැපයුම් ව්‍යාපෘති වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

| අනු අංකය | වැවිලි මානව සංවර්ධන භාර ප්‍රදේශය | ඒකක සංඛ්‍යාව | ඇස්තමේන්තුගත පිරිවැය (රු:) | 2015.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු:) | භෞතික ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 25%-50% | 51%-75% | 100% |
| 01 | නුවරඑළිය | 4 | 4,205,172.89 | 2,017,474.52 | - | - | 4 |
| 02 | හැටන් | 3 | 2,904,744.52 | 560,855.20 | - | - | 3 |
| 03 | ගාල්ල | 2 | 1,747,027.87 | 1,629,761.79 | - | - | 2 |
| 04 | මහනුවර | 2 | 1,938,120.20 | 1,334,536.13 | - | 1 | 1 |
| 05 | කෑගල්ල | 3 | 1,548,249.00 | 1,548,248.49 | 1 | - | 2 |
| 06 | රත්නපුර | 2 | 2,000,000.00 | 1,878,050.50 | - | - | 2 |
| 07 | බදුල්ල | 3 | 2,639,384.16 | 2,399,755.43 | - | - | 3 |
| | | | | | | | |
| | එකතුව | **19** | **16,982,698.64** | **11,368,682.06** | **1** | **1** | **17** |

**18 වන වගුව: 2015 දී අනුමත කරන ලද ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

| අනු අංකය | වැවිලි මානව සංවර්ධන භාර ප්‍රදේශය | ඒකක සංඛ්‍යාව | ඇස්තමේන්තුගත පිරිවැය (රු:) | 2015.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු:) | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | | | 50%-75% | 100% |
| 01 | නුවරඑළිය | 3 | 2,251,547.78 | 673,756.13 | - | 3 |
| 02 | හැටන් | 3 | 2,249,515.04 | 883,950.48 | - | 3 |
| 03 | ගාල්ල | 3 | 2,247,487.79 | 1,826,789.21 | - | 3 |
| 04 | මහනුවර | 3 | 2,210,003.52 | 1,250,986.97 | - | 3 |
| 05 | කෑගල්ල | 3 | 2,280,500.00 | 2,273,893.12 | - | 3 |
| 06 | රත්නපුර | 3 | 2,250,000.00 | 2,157,311.90 | - | 3 |
| 07 | බදුල්ල | 3 | 2,206,018.06 | 2,171,640.30 | 1 | 2 |
| | එකතුව | **21** | **15,695,072.19** | **11,238,328.11** | **1** | **20** |

**19 වන වගුව: 2015 දී අනුමත කරන ලද වැසිකිළි ව්‍යාපෘති වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

| අනු අංකය | වැවිලි මානව සංවර්ධන භාර ප්‍රදේශය | ඒකක සංඛ්‍යාව | ඇස්තමේන්තුගත පිරිවැය (රු:) | 2015.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු:) | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | | | 50%-75% | 100 % |
| 01 | නුවරඑළිය | 100 | 4,483,800.00 | 2,500,872.58 | - | 100 |
| 02 | හැටන් | 125 | 4,817,700.00 | 2,410,121.50 | 64 | 61 |
| 03 | ගාල්ල | 100 | 4,770,000.00 | 4,619,367.01 | - | 100 |
| 04 | මහනුවර | 85 | 4,054,500.00 | 2,189,335.13 | - | 85 |
| 05 | කෑගල්ල | 100 | 10,100,250.00 | 4,633,544.18 | - | 100 |
| 06 | රත්නපුර | 90 | 4,233,000.00 | 4,101573.50 | - | 90 |
| 07 | බදුල්ල | 100 | 4,770,000.00 | 4,130,868.92 | - | 100 |
| | එකතුව | **700** | **37,229,250.00** | **24,585,682.82** | **64** | **636** |

## 8.2 සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම

### 8.2.1 හැඳින්වීම

සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම අභාවප්‍රාප්ත ගරු සෞම්‍යමූර්තී තොණ්ඩමාන් මැතිතුමා ස්මරණය කිරීම පිණිස 2005 අංක 19 දරණ පනත මගින් පිහිටුවන ලදී.

### 8.2.2 දැක්ම

ශ්‍රී ලාංකීය ප්‍රජාවගේ, විශේෂයෙන්ම අඩු වරප්‍රසාද ලත් ග්‍රාමීය ප්‍රජාවගේ ආගමික, ආර්ථික, සාමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, සෞන්දර්යාත්මක මෙන්ම වෘත්තීය හා භෞතික සංවර්ධනය නංවාලීම හා වැඩි දියුණු කිරීම උදෙසා කටයුතු කිරීම සහ එම ප්‍රදේශ වල වෙසෙන තරුණ ප්‍රජාව වෙත ස්වයං රැකියා අවස්ථාවන් හිමිකර දීම.


### 8.2.3 මෙහෙවර

ශ්‍රී ලංකාවේ සියලු ජන කොටස් අතර සාමය, හොඳහිත, අවබෝධය හා සහයෝගිතාවය ප්‍රවර්ධනය කරමින්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පුළුල් ලෙස භාවිත කරමින් ග්‍රාමීය ප්‍රජාව වෙත පූර්ණ සමාජ හා ආර්ථික සංවර්ධනයක් ළඟාකර දීම.

## 8.2.4 අරමුණු (පරමාර්ථ)

- සියලු ශ්‍රී ලාංකීය ප්‍රජාවන් තුල සාමය, හොඳහිත, අවබෝධය හා සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම සහ ජාතීන් අතර සමගිය හා සමාජ ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීම හා දිරි ගැන්වීම සිදු කිරීම.
- ශ්‍රී ලාංකීයයන්ගේ ආගමික, අධ්‍යාපනික, වෘත්තීය, සමාජයීය, දේශපාලනික, ආර්ථික හා සෞන්දර්යයීය මෙන්ම භෞතික සංවර්ධනය වැඩි දියුණු කිරීම හා එම ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුම හා අවබෝධය වැඩි දියුණු කිරීම.
- ආර්ථික හා සාමාජීය වශයෙන් අඩු වරප්‍රසාද ලත් ඕනෑම පුද්ගලයෙකුගේ නිවාස හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමද ඇතුලත්ව ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.
- සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම හා සමාන අරමුණු ඇති දේශීය හා විදේශීය ආයතන සමග සබඳතා ස්ථාපිත කිරීම.
- ශ්‍රී ලංකාව තුල හා විදේශයන්හි, ආර්ථික, දේශපාලනික, අධ්‍යාපනික, සංස්කෘතික හා සමාජයීය ක්ෂේත්‍ර මුල් කර ගනිමින්, සම්මන්ත්‍රණ, වැඩමුළු හා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.
- නෛතික රාමුව හා මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- විනෝද හා ක්‍රීඩා හැකියාවන් වර්ධනය උදෙසා ප්‍රමාණවත් පහසුකම් සැපයීම.
- හැටන් හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, නෝර්වුඩ් ක්‍රීඩා සංකීර්ණය, හා රම්බොඩ පිහිටි සංස්කෘතික මධ්‍යස්ථානය යන ආයතන පදනමේ අරමුණු වලට අනුගත වෙමින් පවත්වාගෙන යාම හා දේශපාලන අරමුණු හැර, කළමණාකරණ මණ්ඩලය සුදුසු යැයි යෝජිත අනෙකුත් කර්තව්‍යයන් සිදු කිරීම සඳහා එම ආයතන යොදා ගැනීම.

## 8.2.5 ආයතනික ව්‍යුහය



ඉහත ආයතන විසින් කරනු ලබන ක්‍රියාකාරකම්වල ප්‍රගති සමාලෝචනය රේඛීය අමාත්‍යාංශ මගින් හා කොළඹ ප්‍රධාන ( මෙහෙයුම් ඒකකය ) කාර්යාලය මගින් සිදු කරනු ලැබේ.

## 8.2.6 සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම යටතේ ක්‍රියාත්මක ආයතන හා ප්‍රධාන වැඩසටහන්

### 8.2.6.1 ප්‍රජාශක්ති (ඊ-කියොස්ක් මධ්‍යස්ථාන). සංවර්ධන වැඩසටහන

**09 වන රූප සටහන: නුවරඑළිය මස්කෙලිය පිහිටි බ්‍රවුන්ස්වික් ප්‍රජාශක්ති මධ්‍යස්ථානය**




මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ විවිධ ප්‍රදේශවල ප්‍රජාශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින්, තොරතුරු සන්නිවේදන තාක්ෂණය පෘථුල ලෙස භාවිත කිරීම හා යොදා ගැනීමත් එම සන්නිවේදනය සහාය කර ගනිමින් අඩු වරප්‍රසාදලත් වතුකරයේ ප්‍රජාවට විස්තීර්ණ වූත්, අංගසම්පූර්ණ වූත්, සමාජ ආර්ථික සංවර්ධනයක් ලබා දීමත්ය. මෙම ව්‍යාපෘති මගින් වරප්‍රසාද අඩු ප්‍රජාවට අන්තර්ජාල හා තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුමද ලබා දෙන අතර, වැවිලි ප්‍රජාවගේ අධ්‍යාපනික, සමාජික, සංස්කෘතික හා ප්‍රජා ක්‍රියාකාරකම් පිළිබඳ ඒකාබද්ධතාවක් ඇති කරවා ගැනීම පමණක් නොව, තාක්ෂණය භාවිත කරමින් මනා දැනුමක් සහිත ව්‍යවසායකයකු ලෙස යොදා ගැනීම සඳහා සහාය වීමක්ද සිදුවේ. මෙම අරමුණු කරා ළඟාවීම සඳහා ව්‍යාපෘතිය මනා ලෙස සැලසුම් කර ඇති අතර, අදියර කිහිපයකින් යුතුව ක්‍රියාත්මක කරනු ලැබේ. ප්‍රජාශක්ති ව්‍යාපෘතිය පහත සඳහන් අංගයන්ගෙන් සමන්විත වේ.

පළමු ප්‍රජාශක්ති මධ්‍යස්ථානය 2006 වර්ෂයේ අප්‍රේල් මාසයේදී වනරාජා වතුයායේ ස්ථාපනය කරන ලද අතර මේ වන විට ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 44 ක් ක්‍රියාත්මක වේ.

### 8.2.6.2 හැටන්හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය

10 වන රූප සටහන: හැටන් පූල් බෑන්ක්හි පිහිටි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය



වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ පැවති මෙම පූල් බෑන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ කළමණාකාරීත්වය, 2007 මාර්තු මාසයේදී, පදනම වෙත භාර දෙන ලදී. පදනමෙහි කළමණාකාරීත්වය යටතේ පළමු සිසුන් කණ්ඩායම පුහුණු කිරීම 2007 වර්ෂයේ ජූලි මාසයේදී ආරම්භ විය. ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයෙහි මැදිහත් වීමෙන් ඉන්දීය විශේෂඥ පුහුණු කරුවන් 07 දෙනෙකුගේ සේවය පිරිවැයක් රහිතව ලබා ගැනීමට හැකිවු අතර මේ වනවිට පුහුණු කරුවන් 05 දෙනෙකුගේ සහාය ලබා ගැනේ. එයට අමතරව ඇතැම් පාඨමාලා සඳහා දේශිය පුහුණු කරුවන්ගේ සහායද ලබා ගනු ඇත. මෙම ආයතනය තුළ කණ්ඩායම් 02 ක් වශයෙන් වාර්ෂිකව සිසුන් 400 කට වෘත්තීය පුහුණුව ලබාදීමට හැකියාව ඇත.

**20 වන වගුව: පූල් බෑන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය යටතේ විවිධ පාඨමාලා සඳහා (2007 - 2015 ) කාල පරිච්ඡේදය තුළ ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව.**

| අංක | පාඨමාලාව | පාඨමාලා කාලය | සිසුන් ඇතුලත්වීම් | |
|---|---|---|---|---|
| | | | 2015 (ජනවාරි හා පෙබරවාරි) | 2007 - 2015 |
| 1 | මෝටර් කාර්මික | වසර 01 | 22 | 144 |
| 2 | විදුලි කාර්මික | වසර 01 | 16 | 129 |
| 3 | කාර්මික ශිල්පි | වසර 01 | 08 | 91 |
| 4 | ගුවන් විදුලි රූපවාහිනී අළුත් වැඩියාව | වසර 01 | - | 66 |
| 5 | සැලසුම් ශිල්පය | වසර 01 | 07 | 45 |
| 6 | ලේකම් පරිචය පිළිබඳ පුහුණුව | වසර 01 | - | 76 |
| 7 | ඇලුමිනියම් ෆැබ්රිකේටර් | මාස 06 | 21 | 278 |
| 8 | ICT | මාස 06 | 22 | 22 |
| 9 | පෙදරේරු ශිල්පී පාඨමාලාව | මාස 06 | 08 | 141 |
| 10 | පරිගණක යෙදවුම් සහයක | මාස 06 | - | 345 |
| 11 | ඇඳුම් නිර්මාණය | මාස 06 | 27 | 430 |

| | | | | |
|---|---|---|---|---|
| 12 | ගෘහස්ථ විදුලි උපකරණ අළුත්වැඩියාව | මාස 06 | 15 | 234 |
| 13 | හෝටල් පාඨමාලා | මාස 06 | 16 | 101 |
| 14 | යතුරු පැදි කාර්මික | මාස 06 | 23 | 231 |
| 15 | වෑල්ඩින්කරුවන් | මාස 06 | 15 | 295 |
| 16 | ඔටෝ කැඩ් පාඨමාලාව (2009 වසරේ සිට අත්හිටුවා ඇත) | මාස 06 | - | 59 |
| 17 | යාන්ත්‍රික මහන මැෂින් ක්‍රියාකරු (2012 වසරේ සිට අත්හිටුවා ඇත) | මාස 03 | - | 132 |
| 18 | AAT (ශිල්පීය ගණකාධිකාරීන්ගේ සංගමය) පාඨමාලාව (2011 වසරේ සිට අත්හිටුවා ඇත) | මාස 06 | - | 91 |
| 19 | වෑද්දුම්කරු (2010 වසරේ සිට අත්හිටුවා ඇත) | මාස 06 | - | 91 |
| **එකතුව** | | | **200** | **3,013** |

## 8.2.6.3 තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය - රම්බොඩ

11 වන රූප සටහන: රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානය.




අඩු පහසුකම් සහිත ප්‍රජාවගේ සංස්කෘතික ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමේ අරමුණින් මෙම මධ්‍යස්ථානය ආරම්භ කර ඇත.

2009 ජූනි මාසයේ සිට කර්ණාටක සංගීතය, වීණා වාදනය, මෘදංග හා වයලීන් වාදන පුහුණුව පූර්ණ කාලීන ගුරුවරයෙකුගේ අධීක්ෂණය යටතේ සිදුකෙරේ. පදනම යටතේ ක්‍රියාත්මක වන සෞන්දර්යය විද්‍යායතනය 2011.08.30 වන දින නිල වශයෙන් විවෘත කරන ලද අතර මෙමගින් වාර්ෂිකව සිසුන් 160 දෙනෙකු සඳහා පුහුණුව ලබා දීමට හැකියාව ලැබෙනු ඇත.

## 8.2.6.4 නොර්වුඩ්හි පිහිටි ක්‍රීඩා සංකීර්ණය

12 වන රූප සටහන: නොර්වුඩ්හි පිහිටි ක්‍රීඩා සංකීර්ණය.



2005 අංක 19 දරණ පාර්ලිමේන්තු පනත මගින් මෙම ක්‍රීඩා සංකීර්ණය 2005 වර්ෂයේදී පදනම වෙත පවරා දෙන ලදී. මෙම ක්‍රීඩා සංකීර්ණයේ පිහිටි පාපන්දු

ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සහ ගොඩනැංවීම සඳහා පදනම හා ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය අතර එකඟතාවක් ඇතිවූ අතර මේ සඳහා ඇස්තමේන්තු ගත වියදම වූ රු. මිලියන 25, ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය මගින් ලබා දෙන ලදී. ක්‍රීඩා පිටියෙහි වැඩකටයුතු 2011 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද අතර වැඩිදියුණු කිරීමේ කටයුතු තව දුරටත් සිදුකල යුතුව ඇත.

ක්‍රීඩාගාරය සහ ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාපිටිය 2012 වසරේ ජුලි මාසයේදි විවෘත කරන ලදී. මාසිකව පාසල් සිසුන් 500-600 අතර පමණ ප්‍රමාණයක් ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාංගනයේ හා කාය වර්ධන මධ්‍යස්ථානයේ පහසුකම් ලබා ගැනීමට පැමිණේ. මේ සඳහා 2015 වර්ෂය තුල සිසුන් 110 දෙනෙකු ලියා පදිංචි වී ඇත. පැසිපන්දු ක්‍රීඩාංගනයක් වොලිබෝල් ක්‍රීඩාංගන දෙකක් හා දැල් පන්දු ක්‍රීඩාංගනයක් 2014 වර්ෂයේදී ඉදි කරන ලද අතර, එය ප්‍රදේශයේ තරුණ තරුණියන් හා පාසල් දරුවන් විසින් පරිහරණය කරනු ලැබේ.

ප්‍රාග්ධන ඉදිකිරීම් අවසන් වූ පසු තරුණ තරුණියන් මෙන්ම දරුදැරියන් දහසකට (1000) පමණ ප්‍රතිලාභ ලබාගැනීමට හැකි වනු ඇත. අදාල පුහුණු වැඩසටහන්ද ඉදිරියේදී ඇරඹීමට නියමිතය.

## 8.2.7 2015 වර්ෂයේ ප්‍රගතිය

2015 වර්ෂය වෙනුවෙන් 2014 වර්ෂයේ අයවැය යෝජනා සැකසීමේදී, ජීවන තත්ත්වය හා මූලික පහසුකම් වැඩි දියුණු කිරීම යටතේ, පදනම වෙත රු මිලියන 200 ක් වෙන් කරන ලද අතර එවකට මෙම පදනම පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ විය.

2015 දී නව රජයේ ආරම්භයත් සමගම සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනමේ රේඛීය අමාත්‍යාංශය වූයේ සමාජ සේවා සුභ සාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයයි. එසේ වුවද, අප්‍රියෙල් මස සිට ජුලි දක්වා කාලයට අදාල වැටුප් ගෙවීමට අමතරව කිසිදු ප්‍රාග්ධන හෝ පුනරාවර්තන පිරිවැයක් දැරීමට ප්‍රතිපාදන මෙම අමාත්‍යාංශය වෙතින් පදනම වෙත ලැබී නොමැත.

මෙකී වාතාවරණය තුල 2015 ජනවාරි මාසයේදී පදනමට අයත් ආයතනයන්හි ආරම්භ කරන ලද පුහුණු පාඨමාලා, පුහුණු වැඩසටහන් හා අනිකුත් මෙහෙයුම් හා ක්‍රියාකාරකම් තාවකාලිකව නවත්වන ලදී.

2015 අගෝස්තු මස පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු නව රජය පිහිටුවීමත් සමගම 2015 සැප්තැම්බර් මස 21 වන දින නිකුත් කල ගැසට් නිවේදනයට අනුව, මෙම පදනම කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතට ගැනුනි. ඒ අනුව අමාත්‍යාංශය මගින් පදනමෙහි කාර්යමණ්ඩල හිඟ වැටුප් ගෙවීමට කටයුතු කරන ලදී.



වැවිලි අංශය රටේ සංවර්ධනය සහතික කිරීමෙහිලා දයක වන ප්‍රධාන අංශයකි. එසේ වුවද විශේෂයෙන් දරිද්‍රතාව, සෞඛ්‍ය හා පෝෂණය, පූර්ව ළමාවිය රැකවරණය, අධ්‍යාපනයට ප්‍රවේශය, සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය, සනීපාරක්ෂාව සහ කාන්තා බලගැන්වීම යනාදී කරුණු සම්බන්ධයෙන් නාගරික හා ග්‍රාමීය අංශයන්හි දර්ශක හා සසඳන කළ වැවිලි අංශයේ වෙසෙන ජනතාව එවැනි පහසුකම්වලින් වඩාත් පීඩිත ජන කොට්ඨාශය ලෙස සැලකේ. මෙම ගැටලු නිරාකරණය කර ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් රජය විසින් මෙම අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදී.

பெருந்தோட்டத்துறை நாட்டின் அபிவிருத்தியை உறுதிப்படுத்துவதில் பங்களிப்புச் செய்யும் பிரதானமான ஒரு துறையாகும். எனினும், குறிப்பாக வறுமைநிலை, ஆரோக்கியமும் போசாக்கும், முன்சிறுவர் பராய பாதுகாப்பு, கல்விக்கான வாய்ப்பு, சுகாதாரப் பாதுகாப்பான குடிநீர், சுகவாழ்வு பாதுகாப்பு, மகளிர் வலுவூட்டல் முதலிய விடயங்கள் தொடர்பில் நகர மற்றும் கிராமிய துறைகளின் குறிகாட்டிகளுடன் ஒப்பிடுமிடத்து பெருந்தோட்டத்துறை வாழ் மக்கள் அவ்வாறான வசதிகளினால் பெரிதும் பலவீனமடைந்த மக்களாக கருதப்படுகின்றனர். ஆகவே இப்பிரச்சினைகளை நிவர்த்தி செய்து அவர்களின் வாழ்நிலையை முன்னேற்றும் நோக்கிலேயே அரசாங்கத்தினால் இவ்வமைச்சு தாபிக்கப்பட்டது.

The plantation sector is one of the main sectors contributing for the assurance of country's development. However, the plantation community is the most deprived community in terms of social development when compared with urban and rural sector indicators particularly on poverty, health and nutrition, early childhood care, access to education, safe drinking water, sanitation and women empowerment. In addressing the above issues, this Ministry was set up by the Government focusing on improving their living standards.


**කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය**

**மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சு**

**Ministry of Hill Country New Villages, Infrastructure and Community Development**